# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,201 — 1960 සැප්තැම්බර් 16 වැනි සිකුරාද — 16.9.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 703 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 711 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 724 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 724 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනු කූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරිහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේ ම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ලංකා යුධ හමුදව—සෙසු නිල පත්වීම්

1. ලංකා යුද්ධ හමුද නිත්‍ය භට සේනාවේ පහත සඳහන් සෙසු නිල පත්වීම් සඳහා යට දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ :—

| | |
|---|---|
| (අ) 1 විමර්ෂණ රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | කෝප්‍රල් ලිපිකරු |
| (ආ) 1 ගගන යාත්‍රා නාශක මුහුදු බඩ තුවක්කු රෙජිමේන්තුව ... | තුවක්කු සෙබළ අරක්කැමියන් |
| (ඇ) 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු බලකාය | කෝප්‍රල් " ඉංජින් පිටර් ප්ලාන්ට් "<br>සාමාන්‍ය සෙබළ/සැපර් ලිපිකරුවන්<br>සාමාන්‍ය සෙබළ/සැපර් රථවාහන යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවකයන්<br>සාමාන්‍ය සෙබළ/සැපර් ගබඩාකරුවන් කාර්මික<br>සාමාන්‍ය සෙබළ/සැපර් යකඩ වැඩකරුවන්<br>සාමාන්‍ය සෙබළ/සැපර් ලියවන වඩුවන් |
| (ඈ) කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය ... | බලලත් නිළධාරි 2 ශ්‍රෙණිය, සහකාර පරිමාන මාණක.<br>කෝප්‍රල් පරිපාලක, (ගොඩනැගිලි 2 ශ්‍රෙණිය)<br>කෝප්‍රල් පරිපාලක, (විදුලි හා යාන්ත්‍රික 2 ශ්‍රෙණිය)<br>කෝප්‍රල් ලිපිකරුවන්, කාර්මික<br>සාමාන්‍ය සෙබළ/සැපර් ගබඩාකරුවන් කාර්මික<br>සාමාන්‍ය සෙබළ/සැපර් පරිපාලක, (ගොඩනැගිලි 3 ශ්‍රෙණිය)<br>සාමාන්‍ය සෙබළ/සැපර් ලිපිකරුවන් |
| (ඉ) ලංකා යුද්ධ හමුද සේවා බලකාය ... ... | කෝප්‍රල් ලිපිකරු—ලඝු ලේඛක<br>කෝප්‍රල් ලිපිකරු |
| (ඊ) ලංකා යුද්ධ හමුද යුද්ධායුධ බලකාය ... ... | සාමාන්‍ය සෙබළ " බූට්ස් " පාවහන් අළුත්වැඩියාකරන්නා |
| (උ) ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය ... | කාර්මික සෙබළුන්—" ඉන්ස්ට්‍රමන් මිකැනික් "<br>කාර්මික සෙබළුන්—ලිපිකරු<br>කාර්මික සෙබළ—" ඉලෙක්ට්‍රෝ ඩිපොසිටර් "<br>කාර්මික සෙබළ—" කෝච් ට්‍රිමර් "<br>කාර්මික සෙබල—ලියවන වඩුවා<br>කාර්මික සෙබළුන්—රථවාහන යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවකයන් |
| (ඌ) ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය ... ... | සාජන්ට් (අධ්‍යාපන උපදේශකයන්.)<br>සාමාන්‍ය සෙබළ ලිපිකරුවන් |
| (එ) හේවිසි තූර්ය වාදක කණ්ඩායම, යුද්ධ හමුද පොදු සේවා බලකාය | ලාන්ස් කෝප්‍රල් සාමාන්‍ය සෙබලුන් |

2. **සාමාන්‍ය කොන්දේසි.**—අයදුම්කරුවකු—

(අ) ලාංකිකයෙක් විය යුතුයි. " ලාංකික " යනුවෙන් අදහස්කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙකු වූ කෙනෙකි.

(ආ) යටත්වශයෙන් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි 5 වන පන්තිය සමත්ව සිටිය යුතුයි.

(ඇ) උස අඩි 5 යි, අඟල් 4ට නොඅඩුවිය යුතුයි.

(ඈ) 1960 සැප්තැම්බර් මස 30 දිනට වයස අවුරුදු 18ට නොඅඩුව ද 40ට නොවැඩිවද සිටිය යුතුයි.

(ඉ) යුද්ධ හමුද ආඥපති තුමාගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

කෙසේවෙතත්, යුද්ධ හමුද ආඥපති තුමාගේ අනුමැතිය ඇතිව, විශෙෂ අවස්ථාවලදී අවුරුදු 40ට වැඩිවන හෝ අඩි 5යි අඟල් 4ට අඩුවෙන් උස ඇති ඇති හෝ අවුරුදු 40ට වඩා වයස් වූද, උස අඩි 5යි, අඟල් 4ට අඩු වූ අය බඳවාගතහැක.

3. මේ තනතුරු සඳහා ඉදිරිපත්වන සේවාමුක්ත භටයෙක් වේ නම්, ඉහත දක්වනලද 2 වන ඡෙදයෙහි සඳහන් සුදුසුකම් වලට අමතර වශයෙන්—

(1) තමා ලංකා ආරක්ෂක හමුදව ඇතුළු බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ යම් හමුදවක අවුරුද්දකට අඩු නොවන කාලයක් සේවයකර ඇති බවට, හා

(2) යුද්ධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනුලැබීමේදී චරිතය " ඉතා හොඳ " යැයි වර්ගකර ඇති බවට සාක්ෂි ඉදිරිපත්කළ යුතුයි.

4. **විශෙෂ සුදුසුකම්.**—ඉහත සඳහන් ඡෙදයන්හි දක්වනලද සුදුසුකම් වලට අමතර වශයෙන් පහත දැක්වෙන තනතුරු වලට ඉදිරිපසින් දක්වා ඇති " විශෙෂ සුදුසුකම් " ඇති අයදුම්කරුවන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.—

| | |
|---|---|
| (අ) කෝප්පරල්/ලිපිකරු, ලංකා සන්නාහ සන්නද්ධ බලකාය ... | වාණිජ විෂයයන් ඇතුළුව ඉංග්‍රීසි කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි.<br>විනාඩියකට වචන 30–40 දක්වා යතුරු ලේඛණය කළහැකි කාර්යක්ෂම යතුරු ලේඛකයෙකු විය යුතුයි.<br>කාර්යාලයීය වැඩකටයුතු පිළිබඳව යටත්වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුයි.<br>ලඝු ලේඛනයකිරීමේ දැනීම හා සිංහල යතුරු ලේඛනය කිරීමේ හැකියාව අමතර සුදුසුකම් වනු ඇත.<br>වයස අවුරුදු 40ට අඩුවිය යුතුයි. |
| (ආ) තුවක්කු සෙබළ/අරක්කැමියන් 1 ගගන යාත්‍රා නාශක මුහුදු බඩ තුවක්කු රෙජිමේන්තුව | වයස අවුරුදු 30ට වැඩි නොවිය යුතුයි.<br>පෙරදිග කෑම පිසීමේ හා පිළියෙල කිරීමේ පළපුරුද්දක් ඇතිව සිටිය යුතුයි. |
| (ඇ) (1) කෝප්පරල්/"ඉංජින් පිටර් ප්ලාන්ට් " 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු බලකාය | සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළින් 6 පන්තිය සමත්කර සිටිය යුතුයි.<br>පොළොව කැනීමේ උපකරණ අළුත්වැඩියාකිරීම ආදිය පිළිබඳව යටත් වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (2) සාමාන්‍ය සෙබළ/සැපර් ලිපිකරුවන් 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු බලකාය | ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ, කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි.<br>ලිපිකරුවන් වශයෙන් වැඩකර ඇති පළපුරුදු අමතර සුදුසුකමක් වනු ඇත. |
| (3) සාමාන්‍ය සෙබළ/සැපර්, රථ වාහන යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවකයන්. 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු බලකාය | ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ 6 පන්තිය සමත්කර සිටිය යුතුයි.<br>රථ වාහන යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවකයන් වශයෙන් වැඩකර ඇති පළපුරුද්ද ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (4) සාමාන්‍ය සෙබළ/සැපර්, ගබඩාකරුවන් කාර්මික, 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු බලකාය | ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි.<br>ගබඩාකරුවන් වශයෙන් වැඩකර පළපුරුද්ද ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (5) සාමාන්‍ය සෙබළ/සැපර්, යකඩ වැඩකරුවන්. 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු බලකාය | යටත්වශයෙන් යකඩ වැඩකරුවන් ලෙස අවුරුදු 2ක් වැඩකළ පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (6) සාමාන්‍ය සෙබළ/සැපර්, ලියවන වඩුවන්. 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු බලකාය | ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ 6 පන්තිය සමත්කර සිටිය යුතුයි.<br>යටත්වශයෙන්, ලීදඬු ලියවන යන්ත්‍ර හා ඇඹරීමේ යන්ත්‍ර ක්‍රියාකරවීමේ අවුරුදු 2ක පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (ඈ) (1) බලලත් නිළධාරි 2 ශ්‍රෙණිය, සහකාර පරිමාන මාණක. කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය | ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන ගොඩනැගිලි පිළිබඳ සංධ්‍යාකාල පන්තියේ 1 වන සහ 2 වන අවුරුදු කාල සීමාව විෂයයන් සියල්ලක්ම ඇතුළුව සාර්ථක ලෙස සම්පූර්ණකර තිබීම<br>නැතහොත්,<br>ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන " සටහන් සකස්කිරීමට පුහුණුවීම " පිළිබඳ ප්‍රාථමික පන්තිය සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටිය යුතුයි.<br>අයදුම්කරුවන් විසින් ඊට අමතර වශයෙන්, විශාල ගොඩනැගිලි කර්මාන්තයක හෝ " ඇදීමේ කාර්යාලයක" යටත්පිරිසෙයින් අවුරුදු 1ක, වැඩකළ පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (2) කෝප්පරල් පරිපාලක (ගොඩනැගිලි 2 ශ්‍රෙණිය) කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය | කණිෂ්ඨය සමත්කර, ලංකා කාර්මික විද්‍යාලයෙහි ගොඩනැගිලි පිළිබඳ සංධ්‍යාකාල පන්තියේ 1 වන අවුරුද්ද සම්පූර්ණකර සිටිය යුතු අතර විශාල ගොඩනැගිලි කර්මාන්තයක අවුරුදු 2 ක වැඩකිරීමේ පළපුරුද්දක් තිබිය යුතුයි.<br>නැතහොත්,<br>කණිෂ්ඨය සමත්කිරීමට අමතරවශයෙන් විශාල ගොඩනැගිලි කර්මාන්තයක යටත්වශයෙන් අවුරුදු 3 ක වැඩකිරීමේ පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (3) කෝප්පරල් පරිපාලක, (විදුලි හා යාන්ත්‍රික 2 ශ්‍රෙණිය) කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය | කණිෂ්ඨය සමත්කර සිටිය යුතුය. ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන විදුලි හා යාන්ත්‍රික කර්මාන්තය පිළිබඳ පන්තියේ 1 වන අවුරුද්ද සාර්ථක ලෙස සම්පූර්ණකර සිටිය යුතුය. රජය යටතේ නැතහොත් ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් යටතේ විදුලි හා යාන්ත්‍රික කර්මාන්තය පිළිබඳ සුළු පරිපාලක තනතුරක අවුරුදු 2ක් සේවයකර ලබන ලද පළපුරුද්දක් තිබිය යුතුය.<br>නැතහොත්,<br>කණිෂ්ඨය දක්වා ලබා ඇති අධ්‍යාපනයට අමතරවශයෙන් රජය යටතේ නැතහොත් ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් යටතේ විදුලි හා යාන්ත්‍රික කටයුතු පරිපාලනය පිළිබඳ යටත්වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (4) කෝප්පරල් ලිපිකරුවන්, කාර්මික කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය | කණිෂ්ඨය සමත්කර විනාඩියකට වචන 20ක් යතුරු ලේඛණය කිරීමේ හැකියාවක් තිබිය යුතුයි. ඊට අමතර වශයෙන් ඉංජිනේරු කර්මාන්ත සංවිධානයක, මුදල් අංශයෙහි " කම්කරු " මිල නියමකිරීම හා වැටුප් ලේඛණ සකස්කිරීම පිළිබඳ සෑහෙන දැනීමක් ඇතිව සිටීම හෝ ඉංජිනේරු ගබඩාවක ද්‍රව්‍ය සැපයීම, ලැජර් පොත්වල වැඩකිරීම ගැන යටත්වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුය. |
| (5) සාමාන්‍ය සෙබළ/සැපර්, ගබඩාකරුවන් කාර්මික කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය | කණිෂ්ඨය සමත්කර විනාඩියකට වචන 15ක් පමණ යතුරු ලේඛණය කළහැකි අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. ඉංජිනේරු ගබඩාවක යටත්වශයෙන් අවුරුද්දක, ගබඩාකරුවකු වශයෙන් වැඩකළ පළපුරුද්දක් තිබිය යුතුයි. සෑම වර්ගයකම ගොඩනැගිලි තැනීමට ගන්නා ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා පිළිබඳ දැනීම අමතර සුදුසුකමක් වනු ඇත. |
| (6) සාමාන්‍ය සෙබළ/සැපර් පරිපාලක, (ගොඩනැගිලි 3 ශ්‍රෙණිය) කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය | ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන ගොඩනැගිලි පිළිබඳ සංධ්‍යාකාල පන්තියේ 1 වන අවුරුද්ද සාර්ථක ලෙස සම්පූර්ණකර සිටිය යුතුයි.<br>නැතහොත්,<br>ගොඩනැගිලි තැනීම පිළිබඳව යටත්වශයෙන් අවුරුදු 2ක පළපුරුද්දක් තිබිය යුතුයි. |

(7) සාමාන්‍ය සෙබළ/සැපර්, ලිපිකරුවන් කාර්මික. කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකාය

යටත්වශයෙන් කණිෂ්ඨය සමත්ව විනාඩියකට වචන 15–20 යතුරු ලේඛණය කිරීමේ හැකියාවක් තිබීම හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ වෙළඳ සමාගමක අඩුවශයෙන් නොකඩවා අවුරුදු 1 ක් ලිපිකරුවකු වශයෙන් වැඩ කිරීමේ පළපුරුද්දක් ලබා සිටීම

(ඉ) (1) කෝප්‍රල් ලිපිකරු—ලඝු ලේඛක, ලංකා යුද්ධ හමුද සේවා බලකාය

වයස අවුරුදු 25ට අඩු විය යුතුයි.

ඉංග්‍රීසි අධ්‍යායන පොදු සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව සිටීය යුතුයි. වාණිජ විෂයයන් ඇතුළුව සමත්ව සිටීම වඩා හොඳ යයි සලකනු ලැබේ.

නැතහොත්,

ඉංග්‍රීසි කණිෂ්ඨය, වාණිජ විෂයයන් ඇතුළුව සමත්ව සිටිය යුතුයි.

යටත්වශයෙන් පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් ඇති කාර්යක්ෂම ලඝු ලේඛකයෙකු විය යුතුයි :—

(1) විනාඩියකට ඉංග්‍රීසි වචන 80ක් ලඝු ලේඛණය කිරීමට හා වචන 30–40 දක්වා ඉංග්‍රීසියෙන් යතුරු ලේඛණය කිරීමට හැකිවීම.

(2) විනාඩියකට සිංහල වචන 60ක් ලඝු ලේඛණය කිරීමට හා වචන 15–25 දක්වා සිංහලෙන් යතුරු ලේඛණය කිරීමට හැකිවීම.

(3) කාර්යාලයීය වැඩකටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම.

(2) කෝප්‍රල් ලිපිකරු, ලංකා යුද්ධ හමුද සේවා බලකාය ...

වයස අවුරුදු 19 ටත් 25 ටත් අතර සිටිය යුතුයි.

කණිෂ්ඨය සිංහල ඇතුළුව සමත්ව සිටිය යුතුයි.

ලඝු ලේඛණය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතු අතර විනාඩියකට වචන 30ක් යතුරු ලේඛණය කිරීමට හැකි විය යුතුයි.

(ඊ) සාමාන්‍ය සෙබළ '' බූට්ස් '' පා වහන් අළුත්වැඩියා කරන්නා ලංකා යුද්ධ හමුද යුද්ධායුධ බලකාය

ඉංග්‍රීසි, සිංහළ හෝ දෙමළ 7 ප්‍රමාණය සමත්කර සිටිය යුතුයි.

මෙ වැඩ කළහැකි විය යුතුයි—

පරණ පාවහන් හම ගැලවීම, '' ටෝ ටිප්ස් '' '' ස්ටඩ්ස් '' සහ පිරවූ ද ගැලවීම, පාවහන් අඩියට අළුත් හමක් දැමීමට සකස්කිරීම, අළුත් හම අඩියක් දමා අනවශ්‍ය කොටස කපාහැරීම.

'' හීල් ටිප්ස් '', '' හීල් ලිප්ට්ස් '', '' ටෝ ටිප්ස් '' සහ ඇණ සවිකිරීම.

විවිධ කාර්යයන් සඳහා වුවමනා ද්‍රව්‍ය තෝරාගැනීම, පාවහන්, '' බූට්ස් '' පාවහන් පාවිච්චියට නුසුදුසු බව දැනගැනීම

(උ) (1) කාර්මික සෙබළුන්—'' ඉන්ස්ට්‍රූමන් මිකැනික් '' ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

වයස අවුරුදු 30ට අඩු අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි.

යතුරුලියනයන් හා අනෙකුත් කර්යාලීය බඩුබාහිරාදිය අළුත්වැඩියා කිරීම, නඩත්තුකිරීම ආදී කටයුතු පිළිබඳව යටත්වශයෙන් අවුරුදු 3ක පළ පළපුරුද්දක් තිබිය යුතුයි.

තෝරාගැනීමට පෙර, අයදුම්කරුවන්ගේ යථොක්ත වෘත්තිය පිළිබඳ දක්ෂ තාවය මැන ගැනීම සඳහා වෘතීය පරීක්ෂණයකට යවනු ඇත.

(2) කාර්මික සෙබළුන්—ලිපිකරු ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

වයස අවුරුදු 30ට අඩු අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි.

ලිපි ගනුදෙනු කිරීම, ඒවා ගොනුකිරීම හා සාමාන්‍ය කාර්යාලීය වැඩකටයුතු පිළිබඳ මනා දැනීමක් තිබිය යුතු අතර යටත් වශයෙන් විනාඩියකට වචන 45 ක් යතුරු ලේඛණය කිරීමේ හැකියාවක් තිබිය යුතුයි.

තෝරාගැනීමට පෙර, අයදුම්කරුවන්ගේ යථොක්ත වෘත්තිය පිළිබඳ දක්ෂ තාවය මැනගැනීම සඳහා වෘතීය පරීක්ෂණයකට යවනු ඇත.

(3) කාර්මිකු සෙබළ—''ඉලෙක්ට්‍රෝ ඩිපොසිටර්'' ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

වයස අවුරුදු 30ට අඩු අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි

යටත් වශයෙන් මේ වෘත්තියෙහි අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුයි.

තෝරාගැනීමට පෙර, අයදුම්කරුවන්ගේ යථොක්ත වෘත්තිය පිළිබඳ දක්ෂ තාවය මැනගැනීම සඳහා වෘත්තීය පරීක්ෂණයකට යවනු ඇත.

(4) කාර්මික සෙබළ—''කෝච්ට්‍රිමර්'' ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

වයස අවුරුදු 30ට අඩු අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි

තෝරාගැනීමට පෙර, අයදුම්කරුවන්ගේ යථෝක්ත වෘත්තිය පිළිබඳ දක්ෂතාවය මැනගැනීම සඳහා වෘත්තීය පරීක්ෂණයකට යවනු ඇත.

(5) කාර්මික සෙබළ—''ලියවන වඩුවා'' ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

වයස අවුරුදු 30ට අඩු අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි.

යටත්වශයෙන් මේ වෘත්තියෙහි අවුරුදු 3ක පළපුරුද්දක් තිබිය යුතුයි. ''කැප්ස්ටන්'' ලියවන යන්ත්‍රය ක්‍රියාකරවීම, (ක්‍රැන්ක්ෂාප්ට් ග්‍රයින්ඩිං) ඇඹරීමේ පළපුරුද්දක් ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරාගැනීමට පෙර, අයදුම්කරුවන්ගේ යථොක්ත වෘත්තිය පිළිබඳ දක්ෂ තාවය මැනගැනීම සඳහා වෘත්තීය පරීක්ෂණයකට යවනු ඇත.

(6) කාර්මික සෙබළුන්—''රථවාහන'' යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවකයන්. ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

වයස අවුරුදු 30ට අඩු අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි

පිළිගත් වෙළඳ සමාගමක හෝ ගරාජයක යටත් වශයෙන් අවුරුදු 3ක් මේ වෘත්තියෙහි යෙදී සිටි පළපුරුද්දක් තිබිය යුතුයි.

තෝරාගැනීමට පෙර, අයදුම්කරුවන්ගේ යථොක්ත වෘත්තිය පිළිබඳ දක්ෂ තාවය මැනගැනීම සඳහා වෘත්තීය පරීක්ෂණයකට යවනු ඇත.

(ඌ) (1) සාජන්ට් (අධ්‍යාපන උපදේශකයන්) ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය

යටත්වශයෙන් පහත සඳහන් සුදුසුකම් වලින් එකක් වත් තිබිය යුතුයි :—

(1) සිංහල පුහුණු ගුරු සහතික පත්‍රය ලබා සිටීම

(2) ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය සමග සිංහල ගුරු සහතික පත්‍රය ලබා සිටීම

(3) ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය හෝ උසස් පාඨශාලා සහතික පත්‍රය සමඟ සිංහල උසස් පෙළ අධ්‍යයන පොදු සහතික පත්‍රය ලබා සිටීම

(4) ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨයෙන් හා සිංහල ජ්‍යෙෂ්ඨයෙන් සමත්ව සිටීම. යටත් වශයෙන් සම්මාන සාමාර්ථ 4ක් අවශ්‍ය වනු ඇත

ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය සඳහා සිංහලෙන් සාමාන්‍ය විද්‍යාව හා ගණිතය ඉගැන්වීමේ හැකියාවක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

ඉගැන්වීමේ පළපුරුද්ද හා අමතර වශයෙන් ඉගැන්වීමට පිළියෙළ කළ දැ ඇතුළු සෑම සුදුසුකමක්ම විස්තර වශයෙන් සඳහන් කළ යුතුයි.

යථෝක්ත සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර ආදියක් ලබා තිබේ නම් ඉදිරිපත් කළ යුතුයි

ඉහත සඳහන් සුදුසුකම් වලට අමතර වශයෙන් පරිවර්තනය කිරීමේ හා පුවත් පත් වලට ලිපි සැපයීමේ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම් කරුවන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) සාමාන්‍ය සෙබළ ලිපිකරුවන්. ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය

ඉංග්‍රීසි විෂයයක් වශයෙන් ගෙන සිංහල කණිෂ්ඨය හෝ ඉංග්‍රීසි කණිෂ්ඨයට නොඅඩු අධ්‍යාපන තත්වයක් තිබිය යුතුයි

සිංහල සහ/හෝ ඉංග්‍රීසි යතුරු ලේඛනය කිරීමේ දැනීම අමතර සුදුසුකමක් වනු ඇත.

(එ) (1) ලාන්ස් කෝපරල්, හේවිසි කණ්ඩායම. ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය

වයස අවුරුදු 20ට අඩු විය යුතුයි

8 වන පන්තිය සමත්කර සිටිය යුතුයි

යටත්වශයෙන් ගාන්ධර්ව සභාවේ පළවන අවුරුද්දේ පරීක්ෂණය සමත්ව සිටිය යුතුයි

යටත්වශයෙන් පහත සඳහන් භාණ්ඩ වලින් දෙකක් වත් වාදනය කළ හැකි විය යුතුයි—

(අ) පිඹීමෙන් වාදනය කරන භාණ්ඩ

(ආ) උපකරණයකින් වාදනය කරන භාණ්ඩ

(2) සාමාන්‍ය සෙබළුන්, හේවිසි තූර්ය වාදක කණ්ඩායම. ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය

වයස අවුරුදු 25ට අඩු විය යුතුයි.

7 පන්තිය සමත්කර සිටිය යුතුයි

බෙර වාදනය පිළිබඳ මනා දැනීමක් හා එය නිසි ලෙස කිරීමේ හැකියාවක් තිබිය යුතුයි.

5. **සේවා කාලය.**—අවුරුදු 12ක සේවය සඳහා බඳවාගනු ලබන සොල්දාදුවකු, පළමු අවුරුදු 5 නිත්‍ය බල සේනාවේද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය බල සේවා බල හමුදවේද, සේවය කිරීමෙන් පසු අස්කරනු ලැබීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සොල්දාදුවකුට ස්වකීය නිත්‍ය බල හමුද සේවය අවුරුදු 12 දක්වා දීර්ඝකරනු ලැබීමටත්, අවුරුදු 32 දක්වා එහිම සේවය කිරීමටත් ඉඩ තිබේ.

6. **වැටුප් හා අතිරේක දීමනා.**—දැනට නිත්‍ය බල සේනාවේ "සෙසු නිල" දරණ භටයින් සඳහා ගෙවනු ලබන වැටුප් සහ අතිරේක දීමනාදිය පහත සඳහන් වේ :—

(අ) හමුදවට බැඳීමේදී 31 දිනක මසකට වැටුප් හා දීමනා.—

| | වැටුප් | ජීවනාධාර මුදල | සලාක දීමනා | ලොන්ඩරි දීමනා | විවාහ දීමනා | ශුද්ධ වැටුප |
|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| **සාමාන්‍ය සෙබළ—** | | | | | | |
| අවිවාහක ... ... | 46 50 | 27 90 | — | — | — | 74 40 |
| විවාහක ... ... | 46 50 | 27 90 | 79 67 | 3 99 | 25 0 | 183 6 |
| **ලාන්ස් කෝපරල්, ලාන්ස් බොම්බඩියර්—** | | | | | | |
| අවිවාහක ... ... | 62 0 | 43 40 | — | — | — | 105 40 |
| විවාහක ... ... | 62 0 | 43 40 | 79 67 | 3 99 | 25 0 | 214 6 |
| **කෝපරල් බොම්බඩියර්—** | | | | | | |
| අවිවාහක ... ... | 93 0 | 49 60 | — | — | — | 142 60 |
| විවාහක ... ... | 93 0 | 49 60 | 79 67 | 3 99 | 25 0 | 251 26 |
| **සාජන්ට්—** | | | | | | |
| අවිවාහක ... ... | 147 25 | 49 60 | — | — | — | 196 85 |
| විවාහක ... ... | 147 25 | 49 60 | 79 67 | 3 99 | 37 50 | 318 1 |
| **මාණ්ඩලික සාජන්ට්—** | | | | | | |
| අවිවාහක ... ... | 170 50 | 49 60 | — | — | — | 220 10 |
| විවාහක ... ... | 170 50 | 49 60 | 79 67 | 3 99 | 37 50 | 341 26 |
| **බලලක් නිළධාරි 2—** | | | | | | |
| අවිවාහක ... ... | 186 0 | 49 60 | — | — | — | 235 60 |
| විවාහක ... ... | 186 0 | 49 60 | 79 67 | 3 99 | 40 0 | 359 26 |
| **බලලක් නිළධාරි 1—** | | | | | | |
| අවිවාහක ... ... | 217 0 | 49 60 | — | — | — | 266 60 |
| විවාහක ... ... | 217 0 | 49 60 | 79 67 | 3 99 | 40 0 | 390 26 |

(ආ) අවිවාහක සොල්දාදුවන් හට නිවාසයන්හි වෙසෙන බැවින් ඔවුනට සලාක දීමනා සහ ලොන්ඩරි දීමනා ගෙවනු නොලැබේ.

7. ඉහත සඳහන් 1 වන ඡෙදයෙහි දක්වෙන ඇබෑර්තු සඳහා එවන ඉල්ලුම්පත්‍ර පහත සඳහන් නීති වලට අනුකූලව විය යුතුයි :—

(අ) ඉල්ලුම්පත්‍ර මෙම ගැසට් නිවේදනය අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍ර පෝරමයේ අනුසාරයෙන් ඉල්ලුම්කරුවන්ගේ අත්අකුරින්ම ලියනලද ඒවා විය යුතුයි. මුද්‍රණය කරන ලද, ටයිප්ගසනලද හෝ ස්ටීරියෝ ටයිප්කරනලද පෝරම පුරවා එවනුලබන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

(ආ) ඉල්ලුම්පත්‍ර ''යුද්ධ භටයින් බඳවන නිළධාරි'' යුද්ධ හමුද මූලස්ථානය, තැ.පෙ. අංක 553, කොළඹ, යන ලිපිනයට එවිය යුතුයි. ඉල්ලුම් පත්‍රයෙහිද, එය බහාලනු ලබන කවරය මතුපිටද, ''ඉල්ලුම් පත්‍රය, නිත්‍ය බල සේනා සෙසු නිල පත්වීම්'' යන්න සඳහන්කළ යුතුයි. ඉල්ලුම්පත්‍ර 1960 සැප්තැම්බර් මස 30 සිකුරාද පස්වරු 4.30ට පෙර යුද්ධ හමුද මූලස්ථානයට ලැබිය යුතුයි.

(ඇ) අයදුම්කරුවන් විසින් ඉල්ලා සිටින තනතුර හා ඒකකය සඳහන් කළ යුතුයි.

(ඈ) ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් සහතිකපත්‍ර වල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි—

(1) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචිකර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනලද වයස පිළිබඳ විශෙෂ සහතිකය ;

(2) තමා විසින් ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(3) ඉල්ලුම්කරුවන් විසින් මෑතදී ලබාගන්නාලද, තමාගේ සුදුසුකම්, චරිතය සහ තමා විසින් ඉල්ලාසිටිනු ලබන තනතුර සඳහා පත්කර ගනු ලැබීම පිණිස යෝග්‍යතාවය පිළිබඳ සහතික තුනක්, ඉල්ලුම්කරු රක්ෂාවක යෙදීසිටින්නේ නම්, මේ සහතික වලින් එකක් තමාගේ වර්තමාන ස්වාමියාගෙන් විය යුතුයි.

සැලකිය යුතුයි.—මේ සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත්කළ යුත්තේ අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් පමණකි. ඉල්ලුම්පත්‍ර සමග සහතික පත්‍රවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැතිවුවහොත් ඊට මෙම කාර්යාලය වගකියනු නොලැබේ.

(ඉ) රජයේ සේවයේ යෙදීසිටින්නවුන් විසින් එවනුලබන ඉල්ලුම්පත්‍ර යථොක්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් එවිය යුතුයි.

(ඊ) අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් නොමැති නම්, මොනම හේතුවක් නිසාවත් ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

(උ) ඉල්ලුම්පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

(ඌ) යම්කිසි අයදුම්කරුවකු, ඔහු විසින් ඉල්ලුම්කරනු ලබන තනතුර සඳහා සුදුසු යයි පෙනීගියහොත්, ඔහුගේ වියදමින්ම, නියමිත වේලාවක, දන්වනු ලබන තැනක, තේරීම් මණ්ඩලයක් ඉදිරියෙහි පෙනීසිටීමට පැමිණෙන ලෙස නියම කරනු ලැබේ.

(ක) සම්මුඛ පරීක්ෂණයෙන් සහ යුද්ධ හමුද තේරීම් මණ්ඩලය විසින් පවත්වනලද අවශ්‍ය අනෙකුත් පරීක්ෂණ වලින් පසු, නිත්‍ය භට සේනාවට පත්කරගැනීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවකුට, ඔහුගේ මේ පිළිබඳ තේරීමත්, යුද්ධ හමුදවට බඳවාගැනීම සඳහා පැමිණිය යුතු දිනයත් ලියා දන්වනු ලැබේ.

(ග) වයස අවුරුදු 21ට අඩු අය, තමාගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරයාගේ කැමැත්ත, පළමුකොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම්, නිත්‍ය භට සේනාවට බඳවාගනු නොලැබේ.

(ජ) තෝරාගනු ලබන සෑම අයදුම්කරුවකුම, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශෙෂයෙන් 1956 අංක 3 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පණවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම, මින් මතු පණවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියාකළ යුතුයි.

(ට) අයදුම්කරුවකු රෙකමදාරු කිරීමට කැමති කෙනෙකු වේ නම්, ඔහු විසින් කළයුත්තේ යථොක්ත අයදුම්කරුට සහතිකයක් දීමෙන්ය. අයදුම්කරුවකුගේ තෝරාගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම්, අයදුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩතිබේ.

(ඩ) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම්පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බව ඔහු තෝරාගැනීමට පෙර දැනගන්ට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම ඔහු යථොක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුනි නම්, විනයානුකූල දඬුවම් ලැබීමටත්, රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

යුද්ධ හමුද මූලස්ථානය,
තැ.පෙ. අංක 553,
කොළඹ. 1960 සැප්තැම්බර් 12 වැනි දින.

කේ. රාජයෝගම්,
මේජර්,
යුද්ධ හමුද ආඥපති වෙනුවට.

## ආදර්ශ ඉල්ලුම්පත්‍ර පෝර්මය

1. (අ) නම පැහැදිලි අකුරින් :————.
(සම්පූර්ණයෙන්)

(ආ) ලිපිනය :————.

2. ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවුඩ කාර්යාලය :————.

3. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

4. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

5. ජාතිය :————.

6. ඉල්ලුම් කරන තනතුර :————.
(එක තනතුරකට එක ඉල්ලුම් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතුයි)

7. කලින් දරණලද යුද්ධ සේවාව පිළිබඳ විස්තර (තනතුර සහ දින සහිතව) :————.

8. මීට ප්‍රථම නාවුක, යුද්ධ හා ස්වේච්ඡා සේවක හමුදවල දරූ තනතුරූ, තත්ත්වය දින ඇතුළුව සම්පූර්ණ විස්තරය :————.

9. යුද්ධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය :————.
(යුද්ධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී ලබාගත් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

10. දින සහිත සමත්වූ විභාග, විෂයයන් සමග :————.
(පාසැල් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).

11. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසු යෙදී සිටින රක්ෂාව :————.

12. වෙනත් සුදුසුකම් ක්‍රීඩා ආදිය :————.

13. උස :————.

14. ගැසට් නිවේදනයේ සඳහන් පරිදි මේ තනතුර සඳහා ඔබ වෙත සුදුසුකම් තිබේද ? ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

15. ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරූ :————.

16. ඉල්ලුම්කරු අත්සනින් සහතික කර සිටින ප්‍රකාශය :————.

ඉහත සඳහන් ප්‍රශ්න වලට මා විසින් සපයනලද පිළිතුරූ මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බවට මෙයින් සහතික කර සිටිමි.

දිනය :————. අත්සන :————.

9008

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### වැඩ උප පරීක්ෂක තනතුර

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වැඩ උප පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර තම අත් අකුරින් ම පුරවා 1960 ඔක්තෝබර් මස 7 වැනි දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ, "බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9" යන ලිපිනයට එවිය යුතුයි.

**ස.ලු.**—ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "වැඩ උප පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණ වග දැනුම් දෙනු නො ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,860 න් පටන් ගෙන රු. 120 වාර්ෂික වැඩිවීම් 16 කින් රු. 3,780 දක්වා වැඩිවන වැටුපක් මෙම තනතුරට හිමි වේ. රු. 2,820 ට පැමිණීමට කාර්යක්ෂමතා කඩඉම්ක් ද වේ.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**—

(අ) පත්වීම ස්ථිර නමුත් විශ්‍රාම වැටුප් රහිත ය. පොදු සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුයි.

(ආ) පත්වීම තුන් අවුරුදු පරීක්ෂාවකට භාජන වේ.

(ඇ) පරීක්ෂා කාලය ඇතුළත ඔහු තවදුරටත් සේවයෙහි රඳවා ගැනීමට නුසුදුසු යැයි මෙහි පහත අත්සන් කරන්නාට හැගේ නම් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

4. **සුදුසුකම්**—

(අ) ලංකිකයෙකුවීම,

(ආ) 1960 ඔක්තෝබර් මස 7 වන දිනට, වයස අවුරුදු 21 ට නො අඩු හෝ අවුරුදු 35 ට නො වැඩි හෝ වියයුතු බව,

(ඇ) සිවිල් ඉංජිනේරු ආධුනිකත්වය පස් අවුරුද්දක් සම්පූර්ණ කොට ඇති බව හෝ සැළැසුම්කරුවෙකු වශයෙන් හෝ ඕවර්සියර් කෙනෙකු වශයෙන් පස් අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂකවරුන් පත් කිරීමේ පරීක්ෂණයෙන් සමර්ථ වී ඇති බව, හෝ

(ඈ) ගොඩනැගිලි තැනීම පිළිබඳ I වෙනි සහ II වෙනි කොටස් ද බිම් මැනීම පිළිබඳ I වෙනි සහ II වෙනි කොටස් ද හෝ සනීපාරක්ෂක ඉංජිනේරු වැඩ පිළිබඳ I වෙනි සහ II වෙනි කොටස් හෝ ඇතුළත් ලංකා කාර්මික විද්‍යාලයේ අනුමත කරන ලද පාඩම් මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කොට ඇති බව සහ ගොඩනැගිලි පිළිබඳ ඉංජිනේරු වැඩ වෙනත් වැඩ ගැන අවුරුදු දෙකක පළපුරුද්ද ඇති බව, හෝ

(ඉ) බිම් මැනීම සහ මට්ටම් කිරීම පිළිබඳ සර්වේ ජෙනරාල් තැන ගෙන් ලබාගත් බලපත්‍රයක් ඇති බව සහ ජල සම්පාදන සහ ඉදිකිරීම් වැඩ පිළිබඳ අවුරුදු දෙකක පළපුරුද්ද ලබා ඇති බව, හෝ

(ඊ) සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආධුනිකත්වයේ පස් අවුරුද්දක් හෝ පස් අවුරුද්දක ආධුනිකත්වය සහ ප්‍රායෝගික පළපුරුද්ද හෝ ඇති, සහ ලිපිකරු වැඩ ගැන මනා දැනීමක් ද, ගොඩනැගිලි තැනීම ගැන හෝ වෙනත් විශාල ඉදිකිරීම් ගැන සහ බිම් මැනීම සහ ලෙවල් කිරීම ගැනද, ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බව. (මෙම කාලසීමාවෙන්, පස් අවුරුදු ආධුනිකත්වයෙන් පසු, අවුරුදු දෙකක් වගකිව යුතු තත්ත්වයක් දරා සිටිය යුතුයි.) හෝ

(උ) ලංකා කාර්මික විද්‍යාලයේ, සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ, අවුරුදු 4 කට නො අඩු පාඩම් මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කොට ඇති බව සහ ඉදිකිරීම් වැඩ පිළිබඳ අවුරුදු දෙකක පළපුරුද්ද තිබිය යුතු බව,

(ඌ) ඉංග්‍රීසි කණිෂ්ඨ පාඨශාලා සහතිකය ලබා ඇති, ඉංජිනේරු වැඩ, ගොඩනැගිලි සහ ජල සම්පාදන කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 10 ක වත් පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ගෙන් ද ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පිටපත් පමණක් ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබාගත් උසස් ම අධ්‍යාපනය පිළිබඳ සහතිකය,

(ඇ) කාර්මික හා වෘත්තීය සහතික,

(ඈ) චරිතය පිළිබඳ ලඟදී ලබාගත් සහතික පිටපත් තුනක්.

6. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ II වෙනි ඡෙදයේ ආරම්භයේ එන, රාජ්‍ය සේවා තනතුරු වලට අදාල පොදු කොන්දේසි බලනු මැනවි.

7. මෙම නිවේදනයේ ප්‍රකාර නො වන සියලුම අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ව. නා. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්.

1960 සැප්තැම්බර් මස 10 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

### බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වැඩ උප පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය

(ස. ලු.—එවිය යුත්තේ සහතික වල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නො එවනවාත් හැර නැපැලෙන් ද නැතිවන සහතික පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව වග කියන්නේ ද නැත.)

1. සම්පූර්ණ නම :————.
   නම :————.
   වාසගම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය හා 1960 ඔක්තෝබර් මස 7 වෙනි දිනට වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————
4. පියාගේ නම හා රක්ෂාව :————.
5. උපන් ස්ථානය :————.
   අයදුම්කරුගේ පියා :————.
   අයදුම්කරුගේ පියාගේ පියා :————.
6. (අ) ජාතිය :————.
   (ආ) ලාංකිකයෙක් ද යන වග :————.
   (1) උත්පත්තියෙන් ද ? :————
   (2) නැතිනම් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද ? :————.
7. කසාද බැඳලා ද නැද්ද යන වග :————.
8. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි) :
   ————.
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
9. කාර්මික සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි) :————.
10. දැනට රක්ෂාවක් තිබේ නම් එය :————.
11. චරිත සහතික දෙනු ලබන්නන්ගේ නම් සහ ලිපිනයන් :
    ————.
12. පාසලින් අස්වූදා සිට කරන ලද රක්ෂාවන් (ස්වාමියාගේ නම, සේවය හා සේවා කාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුයි).

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8982

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව—ප්‍රකාශන අංශය

### භාෂා පරිවර්තක තනතුරු

### සිංහල

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයට සිංහල භාෂා පරිවර්තකයන් සිව් දෙනෙකු පත්කර ගැනීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙයින් තුනක් ස්ථිර තනතුරු වන අතර එකක් තාවකාලික ය. මේ සඳහා එවන අයදුම් පත් පහත සඳහන් ආකෘතියට අනුව සම්පූර්ණ කර 1960 ඔක්තෝබර් මස 1 වැනි දිනට ප්‍රථම මෙම කාර්යාලයට එවිය යුතු ය.

2. **වේතනය හා සේවා කොන්දේසි.**—මේ තනතුරේ වාර්ෂික පඩිය රුපියල් 3,900න් පටන් ගෙන වසකට රුපියල් 180වේ හා රුපියල් 240හේ වැඩිවීම් ඇතිව රුපියල් 6,540 දක්වා නගී. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරු තුන සඳහා තෝරා ගනු ලැබුවන් පත් කරනු ලබන්නේ තුන් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ පරීක්ෂාවට යටත් කොට ය. එක් තනතුරක් තාවකාලික ය.

3. අවශ්‍ය සුදුසුකම්.—(1) සෑම අයදුම්කරුවෙකුම,

(අ) වර්ෂ 1960 ඔක්තෝබර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45ට නොවැඩි වූ අයකු විය යුතු යි. දැනට රජයේ සේවයෙහි නියුක්තවූවන්ට මේ වයස් සීමාව බලපාන්නේ නැත.

(ආ) සිංහල භාෂාව පිළිබඳ විශිෂ්ඨ දැනීමක් ඇත්තන් විය යුතු යි.

(ඉ) කලා හෝ විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලැබූවකු විය යුතු යි. පහත සඳහන් විෂය මාලාවන්ගෙන් උපාධිය ලැබූ අයදුම්කරුවන් ගැන විශේෂයෙන් සලකනු ලැබේ.

**ස්ථිර තනතුරු සඳහා**

1. භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය
2. උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව
3. රසායන විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය.

**තාවකාලික තනතුරු සඳහා**

1. සිංහල, ආර්ථික විද්‍යාව හා ඉතිහාසය.

උපාධි පරීක්‍ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයට ද මේ සඳහා ඉල්ලුම් කළ හැක.

(ඊ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීරසනීපයෙන් යුක්ත විය යුතු යි.

4. (අ) පහත සඳහන් සහතික පත්වල පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකයක්, බවුතීස්ම සහතික පත් හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා නිකුත් කරන ලද සහතික පත් හෝ භාර ගනු නො ලැබේ.
(ii) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් හා/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ව ලැබූ සහතික පත්‍ර,
(iii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මේ තනතුරට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතකදී ලබාගන්නා ලද සහතික පත් 3ක්. දැනට රජයේ සේවය කරන්නන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ.

(ආ) තමා විසින් කර ඇති පරිවර්තනය හෝ වෙනත් රචනා සම්බන්ධයෙන් විස්තර සඳහන් කළ යුතුයි. මේවා සම්මුඛ පරීක්‍ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම්ව තිබිය යුතුයි.

5. අයදුම් පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම්කියුම් මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට නොව "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස්තුමා, තැ. පෙ. 520, කොළඹ" කියා එවිය යුතුයි.

6. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ දෙවන ඡෙදයේ පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්කිරීම් පිළිබඳව පොදු කොන්දේසි බලනු මැනැවි.

7. දැනට රජයේ සේවයේ නියුක්ත අය විසින් එවන ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතු යි. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාර ගනු ලබන්නේ ඒවා තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ට නියමිත දිනට ප්‍රථම භාර දී තිබී ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස හේතු සහිතව නිර්දේශ කළහොත් පමණකි.

8. සෑම අයදුම් පතක් ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් භාර ගැනීම නවත්වා තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුනහොත් ඔහු විසින් වහාම ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් තැනට පළමු කී ලිපිනයට දැන්විය යුතුයි. ඔහු මෙසේ නො කළ හොත් ඔහුගේ එම අයදුම් පත ගැන සලකා බැලීමට ඇති යුතුකම් නැති වේ.

රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශෙෂ කොමසාරිස් තැන.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
ප්‍රකාශන අංශය,
තැ. පෙ. 520, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සිංහල භාෂා පරිවර්තක ධුරය සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරින්)
(අ) අගට යෙදෙන නම :————.
(ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. (අ) 60.10.1 වැනි දිනට නිවැරදි වයස :—
වර්ෂ :———, මාස :————, දින :————.
(ආ) උපන් දිනය :————.

4. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.

5. උපන් ස්ථානය :————.
(අ). ඉල්ලුම්කරුගේ :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.
(ඉ) ඉල්ලුම්කරුගේ සීයාගේ :————.
(ඊ) ඉල්ලුම්කරුගේ සීයාගේ පියාගේ :————.

6. ඉල්ලුම්කරු විවාහකද ? අවිවාහකද ? එසේ නැත්නම් විවාහයෙන් පසු පුරුෂයා හෝ භාර්යාව මැරුණු අයෙක් ද ? විවාහක නම් විවාහ වූ දිනය හා දරුවන් ගණන :————.

7. ඉගෙනීම කළ පාඨශාලා හා විද්‍යාලවල නම් :————.
(ඇතුළත් වූ දිනය හා අස්වූ දිනය සඳහන් කළ යුතුයි.)

8. සාමාන්‍ය අධ්‍යයනය ඉල්ලුම් කළ විෂයයන් සහිතව :————.

9. සිංහල. භාෂාවෙන් ලැබූ උසස් ම සුදුසුකම් :————.

10. පරිවර්තන සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ දැනීම ද, කෘතහස්තතාව ද පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර හා පත් වූ හා අස් වූ දින ද, ලැබූ වේතනය ආදියෙහි විස්තර :————.

12. විශේෂ සුදුසුකම් හෝ පුහුණුවීම්, එසේ නැතහොත් මේ සඳහා කිව හැකි වෙනත් කාරණා පිළිබඳ විස්තර :————.

13. අයදුම්කරු සම්බන්ධයෙන් වග කිව හැකි ඥාතීන් නොවන තුන් දෙනකුන් ගේ නම්, තරාතිරම් හා ලිපිනය : මේ අය පෞද්ගලික ජීවිතයෙහි අයදුම්කරු හොඳින් දන්නා අඳුනන අය විය යුතු යි. රාජ්‍ය සේවායෙහි නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය :————.

14. වෙනත් කරුණු :————.

මේ අයදුම් පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියලුම විස්තර නිවැරදි, සත්‍ය කරුණු බව මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුව හොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවක් ඔප්පු වුව හොත් කිසිම වන්දියකට මා අහිමි වි පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතු වන බව හොඳාකාර දන්නා බව ද, ප්‍රකාශ කරමි.

————,
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

8960

---

## ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### සැලසුම් කැමරා ක්‍රියාකරුවෙකු (ප්‍රොසෙස් කැමරා ඔපරේටර්) සඳහා ස්ථිර පත්වීමක්

රජයේ මුද්‍රණාලයේ සැලසුම් කැමරා ක්‍රියාකරුවෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් විය යුතු ඉල්ලුම් පත්‍ර 1960 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ ඊට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිට ලැබෙනසේ එවිය යුතුය. නියමිත ආකෘති පත්‍රයේ සකස් වී නැති ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

2. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයෙන් පසු දින 7 ක් ඇතුළත ඉල්ලුම් පත්‍රය ලැබුණු බව හැඟවීමේ දැනුම්දීමක් නොලැබුණහොත් වහාම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ඒ බැව් දැන්විය යුතුය. මෙකී ප්‍රකාර ක්‍රියා නොකළහොත් සලකා බැලීම සඳහා තිබෙන අයිතිවාසිකම්වලට ඉල්.ලුම් කරු අහිමිවනු ඇත.

3. තෝරා ගැනීමට ප්‍රථම නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායොගික පරීක්ෂණයකට භාජන කරනු ලැබේ.

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—ආණ්ඩුවේ සේවයට කෙරෙන පත්කිරීම් පිළිබඳව ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි කොටසේ සඳහන් වන සාමාන්‍ය නීති රීති ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුය. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු තුන් අවුරුදු සෝදිසි කාලයක් යටතේ පත්කරගනු ලැබේ.

5. අයදුම්කරුවන්ට බ්ලොක් සෑදීම සඳහා සැලසුම් කැමරා ක්‍රියාකරුවෙකු වශයෙන් සාර්ථක ලෙස අවුරුදු 5ක ආධුනික සේවා කාලයක් සමග යටත් පිරිසෙයින් අවුරුදු දහයකවත් පළපුරුද්දක් තිබිය යුතුය.

6. වැටුප්.—2 වන ශ්‍රේනියේ ස්ථිර තනතුර සඳහා අදාළ වැටුප් ක්‍රමය නම්: රු. 1,296—42—1,758 ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව සහ තාවකාලික විශෙෂ දීමනාව යන මෙම දීමනා ආණ්ඩුවේ රෙගුලාසීන්ට අනුව ගෙවනු ලැබේ.

7. තෝරාගනු ලබන අයදුම්කරුට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට සහ දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ වැඩ කිරීමට නියම කරනු ලැබේ.

8. ආදර්ශ ආකෘති පත්‍රයේ 8 (ඇ) දරණ පේලියෙන් අවශ්‍යයැයි පෙන්වා ඇති ළඟදී ලබාගන්නා ලද සහතික පිටපත් (ඒවා ආපසු එවනු නොලැබේ.) තුනක් අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. යටත් පිරිසෙයින් ඉන් දෙකක්වත් අයදුම්කරුගේ චරිතය සහ ඍජු භාවය පිළිබඳ සහතික විය යුතුය. ඉල්ලුම් පත්‍රය පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස්කර ගත යුතුය. මුද්‍රිත ආකෘති පත්‍ර නොමැත. ඉල්ලුම් පත්‍ර ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුය. පෞද්ගලිකව මෙම දෙපාර්ත මේන්තුවේ වෙන කවර නිලධාරියකුගේ හෝ නමට නොඑවිය යුතුය.

9. කිසියම් අයදුම්කරුවකු වෙනුවෙන් ආණ්ඩුවේ මුද්‍රණලයාධිපති හෝ දෙපාර්තමේන්තුවේ වෙනයම් නිලධාරියකු සම්මුඛ ව සාකච්ඡා කිරීමට උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම එම අයදුම්කරු නුසුදුසු බවට පත් වන්නේ ය.

10. යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

11. මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර හෝ ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1960 සැප්තැම්බර් 12 දින,
කොළඹ ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**බ්ලොක් සෑදීමේ අංශයේ සැලසුම් කැමරා ක්‍රියාකරුවෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය.**

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) (අ) ඉල්ලුම්කරු උපන් දිනය සහ ගම :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ගම :————.

(4) ඉල්ලුම්කරුගේ වයස : අවුරුදු :——, මාස : ——.

(5) විවාහක හෝ අවිවාහක බව :————.

(6) ජාතිය :————.
(අ) ලාංකිකයකු නම් ලියාපදිංචිවීමෙන් ද පරම්පරාවෙන් ද යන වග :————.
(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ඔබ ලාංකිකයකු නොවන්නෙහි නම් ලියාපදිංචිවීමෙන් ලංකා පුරවැසි බව ලබාගැනීමට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා වෙත ඉල්ලුම්කර යැවුවෙහිද ? මේ සම්බන්ධ ගන්නා ලද ක්‍රියා මාර්ගයක් වේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(7) බ්ලොක් සෑදීම සඳහා සැලසුම් කැමරා ක්‍රියාකරුවෙකු වශයෙන් පළපුරුද්ද ලබා ඇති කාලය, ඒ පිළිබඳ විස්තර සහ අයදුම්කරු වැඩ කරන ලද වෙළඳ සමාගම්වල නම් :————.

(8) පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුයි :—
(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;
(ඇ) චරිතය හා දක්ෂතාවයන් පිළිබඳ මෑතකදී ලබාගත් සහතික තුනක් ;
(ඈ) ඉහත සඳහන් අංක 7 දරණ තීරයේ කරුණු සනාථ කිරීම සඳහා සහතික.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9093

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

**තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායකයින් බඳවා ගැනීමේ විභාගය**

අංක 12,193 සහ 1960 සැප්තැම්බර් මස 2 වෙනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ (පළකිරීම්) I වෙනි කොටසෙහි II වෙනි ඡේදයෙහි 668 වෙනි පිටුවේ පළකරන ලද 1960 අගෝස්තු මස 26 වෙනි දින දරන නිවේදනය සම්බන්ධවයි. ගැසට් නිවේදනයේ 5 වෙනි ඡේදයෙහි සඳහන් (ආ) සිට (ඈ) දක්වා ඇති අනුග්‍රහයන් යටතේ මෙම විභාගයට ඇතුලත්වීමට බලාපොරොත්තුවන තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවකයින් 1960 ඔක්තෝබර් මස 8 වෙනි දිනට, සඳහන්කර ඇති ඡේදයෙහි නියමකර තිබෙන සුදුසුකම් ලැබීමේ අඩුම සේවාකාලය සම්පූර්ණකර තිබිය යුතුය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ,
1960 සැප්තැම්බර් මස 7 වෙනි දිනදීය.

9078

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

**ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—(ඉංග්‍රීසි)**

ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රු. 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් වර්ෂ 1960ක්වූ ජූනි මස 21 වැනි දින පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලඝු ලේඛකයන් සහ ලඝු ලේඛිකාව සමර්ථ වී ඇති බැව් මෙයින් දැනුම් දෙමි. ඔව්හු යථෝක්ත කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට දැන් සුදුසුකම් ලබා ඇත :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| පීරිස්, එම්. සී. ඩී. සී. | ... | ආණ්ඩුවේ සංචාරක කාර්යාංශය. |
| පෙරේරා, පී. ඩී. (මෙනෙවිය) | ... | ජාතික නිවාස. |
| ප්‍රනාන්දු, එම්. සී. එන්. ආර්. | ... | මහේස්ත්‍රාත් උසාවිය, කළුතර. |
| ප්‍රනාන්දු, එස්. ජේ. එම්. | ... | නීති කෙටුම්පත් කරුගේ. |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. සී. එල්. | ... | පොලිස්. |
| සිරිසේන, සී. | ... | ඉඩම් කොමසාරිස්ගේ. |
| සිල්වා, එස්. ඊ. එල්. | ... | අල්ලස් කොමිසම. |
| සෙනෙවිරත්න, එස්. පී. ජේ. | ... | අධ්‍යාපන. |

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේදීය.

9089

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්ත මේන්තුව විසින් සපයනු ලබන උපකරණ වලින් ලේඛන ආදිය (රූල් සහිත සහ රහිත) සාදා සැපයීම සඳහා 1960 ඔක්තෝබර් 4 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 ඔක්තෝබර් 3 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 සැප්තැම්බර් 16 වැනි දින,
කොළඹදීය.

9071

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1960 නොවැම්බර් 9 වැනි දින පෙරවරු 11 දක්වා, රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 නොවැම්බර් 10 වැනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින්, ඒ සඳහා පැමිණ සිටීමට කැමති ටෙන්ඩර් කරුවන්ට එසේ කළ හැක.

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංකය |
|---|---|
| (1) රබර් ටයර් සහිත ට්‍රැක්ටර් ඩෝසර් | ඩී.එල්.එෆ්ජ්. 60 |
| (2) ගිලන් රථ | ඩී.එල්.එෆ්ජ්. 65 |
| (3) ස්ටේෂන් වැගන් වගීයේ රථ | ඩී.එල්.එෆ්ජ්. 67 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් පෝරම ලබාගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාතර්මේන්තුවෙන් ලබාගත හැක.

ඩු. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 සැප්තැම්බර් 12 වැනි දින,
කොළඹ 2.

9072

---

## ටෙන්ඩර් මාගීයෙන් රේගුවේ බීඩි විකිණීමයි

කොළඹ භාණ්ඩාගාරයේ අංක 270 දරණ කාමරයේ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ), පහත සඳහන් කරන බීඩි මිලයට ගැනීමේ සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960, ඔක්තෝබර් 4 දින දහවල් 12 වනතුරු භාරගන්නවා ඇත.

(අ) එක බන්ඩලයක පැකට් 24ක් ඇතුළත් සාමාන්‍ය වශයෙන් බණ්ඩලයක් රාත්තල් 32ක් බර ඇති බීඩි (රාම් සේට් සොක්කලාල්) බණ්ඩල් 90ක්.

(ආ) පහත සඳහන් බර ප්‍රමාණයන්ගෙන් යුත් බීඩි ගෝනි 19ක්.

එකක් රා. 28 ක් බර ගෝනි 2ක්.
එකක් රා. 36 ක් බර ගෝනි 3ක්.
එකක් රා. 28¼ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 18½ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 29½ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 21½ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 26 ක් බර ගෝනි 2ක්.
එකක් රා. [illegible]¼ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 19½ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 32½ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 31 ක් බර ගෝනි 1ක්.
එකක් රා. 33 ක් බර ගෝනි 2ක්.
එකක් රා. 23½ ක් බර ගෝනි 1ක්.
එකක් රා. 40½ ක් බර ගෝනි 1ක්.

2. මඩකලපු දිස්ත්‍රික්කයේ තීරුබදු අයකරන නිලධාරි තැනගේ කායභීලයේ තැන්පත් කරන්ට යෙදුනු රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් මඩකලපු දිස්ත්‍රික්කයේ තීරුබදු අයකරන නිලධාරි තැනගෙන්, මහභාණ්ඩාගාරයෙන්, හෝ ඕනෑම කච්චේරියකින් ලබාගුත හැකි පෝර්මයක දෙවෙනි පිටපතකුත් සමග ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ඇතුලත් ලියුම් කවරයේ වම් අත පැත්තේ උඩින් "බීඩි සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුයෙන් සඳහන්කොට, රෙජිස්ටර් තැපෑලෙන් කොළඹ තැ. පෙ. 500, මුදල් අමාත්‍යාංශය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ටෙන්ඩර් විවෘත කරන නියමකරන ලද් වේලාවට පෙර ලැබෙන්ට කොළඹ, ගාලුමුවදොර, මහලේකම් කායභීලයේ අංක 270 කාමරයේ මුදල් අමාත්‍යාංශයේ, 'ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කායභීලයේ ඒ පත්‍රයෙන් තබා ඇති පෙට්ටි තැන්පත් කළ යුතුයි.

4. මඩකලපුවේ, තීරුබදු අය කරන නිලධාරි කායභීලයේදී බීඩි පරීක්ෂාකර බලන්ට පිළිවන.

5. ටෙන්ඩර් කරුවන්ට, ඉහත සඳහන් කල ස්ථානයේදී එකී වෙලාවට ටෙන්ඩර් පත්‍ර විවෘතකරනවා බැලීමට අවසර තිබේ.

6. එයට සහභාගිවෙන රේගු නිලධාරීන්ගේ කුලිය සා සම්පූර්ණ වටිනාකම ගෙවීමෙන් පසුව තෝරාගන්නා ටෙන්ඩර් කරුවාට, බඩු බාර දෙනවා ඇත.

7. ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරනයයි. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමට හෝ කිසියම් ටෙන්ඩරයක් භාර ගැනීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය තිබේ.

8. මඩකලපුවේ, තීරුබදු එකතු කිරීමේ නිලධාරි කායභීලයෙන් තව දුරටත් විස්තර ලබාගැනීමට පිළිවන.

ඒ. සිදම්පර පිල්ලෙයි,
තීරුබදු අයකරන නිලධාරිතැන, මඩකලපුව.

රේගුව, මඩකලපුව,
සැප්තැම්බර් 1960.

9044

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 1, මහලේකම් ගොඩනැගිල්ලේ නො. 355 වැනි කාමරයේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාගී හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වාරිමාගී දෙපාර්තමේන්තුවේ කොළඹ උප කොට්ඨාශයේ මුතුරාජවෙල යෝජනා ක්‍රමයේ වත්තල පාලමක් සහිත රෙගුලේටරයක් (Bridge-cum-Regulator) සෑදීම සඳහා 1960 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ.

වාරිමාගී, දුම්රිය සහ ප්‍රසිද්ධ වැඩ යන දෙපාර්තමේන්තුවලින් එකක රුපියල් ලක්ෂයකට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක. කොළඹ 8, කොටාරෝඩ්හි පිහිටි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන පුරවා අනුපිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුය. කොළඹ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමා වෙත හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250ක් තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ 8, කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගතහැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂක තැන වෙනුවට.

වෂී 1960 සැප්තැම්බර් මස 9 වැනි දින,
කොළඹ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

9036

---

## වාරිමාගී දෙපාතීමේන්තුව—බටහිර කොට්ඨාශය

කොළඹ 8 කෝට්ටේ පාරේ බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින්—

(1) බෝගහපිටිය අමුණ හා බෙම්මුල්ල අමුණ සංවර්ධනය කිරීම.

(2) ඉහළ කෝට්ටේ අමුණ සංවර්ධනය කිරීම.

යන වැඩ සඳහා පිළිවෙලින් මෙම දෙපාතීමේන්තුවේ රු. 7,000 සහ 6,000 හෝ ඊට වැඩි ප්‍රමාණවලට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960. 10. 11 වැනි අඟහරුවාදා පෙරවරු 11.30 දක්වා වෙන වෙනම මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් බාරගන්නවා ඇත.

මේ පිළිබඳ වැඩි විස්තර සැලැස්ම හා ටෙන්ඩර් පෝර්ම පත්‍ර අත්තනගළු ඔය යෝජනා ක්‍රමයේ උප ප්‍රාදේශීය වාරිමාගී නිලධාරි තැනගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත් එවිය යුත්තේ අනු පිටපතක්ද සමගය.

ටෙන්ඩර් පත් 1960 සැප්තැම්බර් මස 23 වන දින සිට 1960 ඔක්තෝබර් මස 7 වන දින් දක්වා කායභීලයන්හි රාජකාරි කරන වේලාවන් අතරදී ලබාගත හැක. ඒ සඳහා ඕනෑම කච්චේරියක හෝ මෙහි පහත සඳහන් කායභීලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් තම සුදුසුකම් සමග ඉදිරිපත් කිරීම අවශ්‍යවේ.

යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රශ්න රහිතව ප්‍රතික්ෂෙප කිරීමත් ඕනෑම ටෙන්ඩර් පතක ඕනෑම කොටසක් පිළිගැනීමේත් බලය රජය සතුවේ.

ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කළ අයට කැමති නම් පැමිණ සිටිය හැක.

පී. ඇල්. එම්. බලදස,
උප ප්‍රාදේශීය වාරිමාගී නිලධාරී,
අත්තනගළු ඔය යෝජනා ක්‍රමය.

වාරිමාගී කායභීලය,
ගම්පහ, 1960.9.2.

9047

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1960/61 මුදල් වර්ෂය තුළ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගාළු උප කොට්ඨාශයේ මාතර, ගාල්ල සහ අම්බලන්ගොඩ සම්බන්ධිත ප්‍රදේශවල බඩු එහා මෙහා ගෙන යාම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් පන්දහසකට (රුපියල් 5,000) හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 ඔක්තෝබර් මස 11 වෙනි දින, පෙරවරු 10 වන තෙක් තංගල්ලේ, දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. 1960 ඔක්තෝබර් 3 වෙනි දින සිට 8 වෙනි දින දක්වා, පහත අත්සන් කරන මා විසින් කාර්යාලීය වේලාවන්හිදී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා කොන්ත්‍රාත් කරුවන් සිය "රෙකෝඩ් පොත්" කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතරම, දැනට ආණ්ඩුව යටතේ කොන්ත්‍රාත් වැඩ කරගෙන යනු ලබන අය විසින් එහි සඳහන් වැඩවල සතුටුදායකත්වය පිළිබඳ ඊට සම්බන්ධිත නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත් ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

3. වැඩි විස්තර සඳහා ගාල්ලේ, ගාළු උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් විමසන්න.

ඇම්. සී. බී. මැන්දිස්,
ගාළු උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960 සැප්තැම්බර් මස 6 වෙනි දින,
ගාල්ලේ වාරිමාර්ග කාර්යාලයේ දීය.

8948

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ගාළු දිස්ත්‍රික්කයේ හිපන් ඇල අමුන ව්‍යාපාරය තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000.00 කට හෝ ඊට වැඩි වශයෙන් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 ඔක්තෝබර් මස 11 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

1960 ඔක්තෝබර් මස 3 වෙනි දින සිට 8 වෙනි දින දක්වා කායභාලීය වේලාවන්හිදී ටෙන්ඩර් පත්‍ර පහත අත්සන් කරන මා විසින් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පෙර එක ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 50.00 ක් කච්චේරියක හෝ මෙම කායභාලයේ හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී සටහන් පොත් ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම ඔවුන් දැනට රජයේ කොන්ත්‍රාත් වැඩෙහි යෙදෙන්නේ නම් ඒ පිළිබඳ සහතිකයක් ඒ භාර නිලධාරීන්ගෙන් ලබා ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ඇම්. සී. බී. මැන්දිස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, ගාළු උප කොට්ඨාශය.

වාරිමාර්ග කායභාලය, ගාල්ල,
1960. 9. 8.

9038

---

## වාරිමාර්ග දෙපාතීමේන්තුව

දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ගාළු දිස්ත්‍රික්කයේ දෙරපෙ ඇලේ අංක 2 දරන අමුන ව්‍යාපාරය තැනීම සඳහා මෙම දෙපාතීමේන්තුවේ රු. 50,000.00කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් 1960 ඔක්තෝබර් මස 11 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1960 ඔක්තෝබර් මස 3 වෙනි දින සිට 8 වෙනි දින දක්වා කායභාලීය වේලාවන්හිදී ටෙන්ඩර් පත්‍ර පහත අත්සන් කරන මා විසින් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පෙර එක ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 50.00ක් කච්චේරියක හෝ මෙම කායභාලයේ හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී සටහන් පොත් ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම ඔවුන් දැනට රජයේ කොන්ත්‍රාත් වැඩෙහි යෙදෙන්නේ නම් ඒ පිළිබඳ සහතිකයක් ඒ භාර නිලධාරීන්ගෙන් ලබා ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ඇම්. සී. බී. මැන්දිස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, ගාළු උප කොට්ඨාශය.

වාරිමාර්ග කායභාලය, ගාල්ල.
1960.9.8,

9049

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මඩකලපුවේ පිහිටි ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායභාලය සහ බංගලාව ජල ගැල්මට යටවීම වැලැක්වීම පිණිස, ඉහත සඳහන් බංගලාව සහ කායභාලය උස්කිරීම සඳහා, මඩකලපුවේ, නැගෙනහිර කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන මෙම දෙපාර්තමේන්තුවේ රු. 25,000.00 ට සහ ඊට වැඩි ගණන්වලට ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන්ගෙන් වර්‍ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටැන්ඩර් භාර ගන්නවා ඇත.

ටැන්ඩර් ඉදිරිපත්කළ යුත්තේ වෙන්කලඩිහී, රුගම් උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝරමවල අනුපිටපත් බැගින් වර්‍ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 4 වෙනි අඟහරුවාදා දක්වාය.

තවද මඩකලපුවේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායභාලයේ මේ සඳහා තබා තිබෙන "ටැන්ඩර් පෙට්ටියේද" ටැන්ඩර් තැන්පත් කල හැක. ටැන්ඩර් මඩකලපුවේ, නැගෙනහිර කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් වර්‍ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 5 වෙනි දින පෙරවරු 10ට විවෘත කරනු ලබන බැවින්, ටැන්ඩර කරුවන් සතුටු නම්, ඔවුන්ට ඒ අවස්ථාවේ එහි සිටිය හැක.

ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන් වටිනා කමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචිවී සිටින බව ඔප්පු කළ හැකි අයවළුන්ට පමණයි. තවද එම අයවළුන් වාරිමාර්ග තැන නමට රු. 25 කුවිතාන්සියක් හෝ මනි ඕඩරයක්ද ඉදිරිපත් කළ යුතුයි.

දැනට රජයේ කොන්ත්‍රාත්වල යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන් එම කොන්ත්‍රාත් වැඩ සම්බන්ධව සතුටුදායක දියුණුවක් ඇතිකර ගෙන තිබෙන බවට එකී වැඩපොලවල් භාරව සිටින නිලධාරීන්ගෙන් පිළිවෙලින් සහතික ලබා ගෙන එම සහතික ටැන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර නා. ප. වෙන්කලඩිහි, රුගම් උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් දැනගත හැක.

සී. ජයසිංහ,
වාරිමාර්ග ඉංජිනේරුතැන.
රුගම් උප කොට්ඨාශය.

වාරිමාර්ග කායභාලය,
වෙන්කලඩි.

9043

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් හුරුළුවැව උප කොට්ඨාශය යටතේ කෙරෙන කියුලේකඩ වැව ව්‍යාපාරයේ වැඩ සඳහා 1960 ඔක්තෝබර් මස 1වැනි ශනි දින පූ.භා. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

1. සැතැපුම් 2යි දම්වැල් 19යේ අඩි 100ක වතුර බැස යෑමේ වානක් ඉදිකිරීම ;
2. සැතැපුම් 0, දම්වැල් 65 සහ සැතැපුම් 4යි දම්වැල් 6යේ වතුර බැස යෑමේ වාන දෙකක් ඉදි කිරීම ;
3. සැතැපුම් 3යි, දම්වැල් 7තේ අඩි 55 වතුර බැස යෑමේ වානක් ඉදිකිරීම ;
4. හුරුළුවැවේ දකුණු ඉවුරේ සැතැපුම් 9යි, දම්වැල් 38 ඇල හරහා පාලමක් දැමීම ;
5. අඩි 150ක් දිග වාන සෑදීම ;
6. අඩි 3ක් විෂ්කම්භය ඇති හියුම් පයිප්ප වලින් අඩි 200ක් දිග බෝක්කුව සෑදීම.

1960 සැප්තැම්බර් මස 12 වැනි දින සිට ඔක්තෝබර් මස 6 වැනි බ්‍රහස්පතින්දා සවස 4.30 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරනු ලබන්නේ වාරිමාර්ග දෙපාතීමේන්තුවේ රු. 15,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත් කරුවන්ට සහ ඒ අය ටෙන්ඩර් සඳහා රු. 25ක් ඕනෑම කච්චේරියක හෝ මෙගොඩවැව පිහිටි හුරුළුවැව උප කොටසේ වාරිමාර්ග කායභාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයට පමණි.

හුරුළුවැව උප කොටසේ හුරුළුවැව උප කොටස භාර නිලධාරි තැන ගෙන් ටෙන්ඩර් පෝරම සහ වැඩි විස්තර ලබාගත හැක. ටෙන්ඩර් පෝරම පිටපත් දෙක බැගින් යුක්තව ඉදිරිපත් කළ යුතුය.

ඒ. ඇෆ්. මහගමගේ,
හුරුළුවැව උප කොටස භාර නිලධාරි තැන
හුරුළුවැව උප කොට්ඨාශය.

8834

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

අනුරාධපුරය, උතුරු මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් අනුරාධපුරය උප කොට්ඨාශය තුළ 1960—61 වර්ෂය තුළ ගබඩා ද්‍රව්‍ය එහා මෙහා ගෙනයාම හා පොල් අතු සැපයීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000කට හෝ රුපියල් 10,000කට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබෙන මුද්‍රා තබන ලද ටැන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් මස 28 වෙනි බදාදා 10 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට පෙරටුව රුපියල් 25ක මුදලක් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලද රිසිට් පතක් ඉදිරිපත් කරන ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට 1960 සැප්තැම්බර් මස 19වෙනි දින පටන් 1960 සැප්තැම්බර් මස 26 වෙනි දින අ.භා. 4.30 දක්වා පමණක් ටැන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

3. ටැන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව භාරදිය යුතුවත් හැර මේ පත්‍රිකා ලබාගත යුත්තේ අනුරාධපුරය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙනි. වැඩිදුර විස්තර සඳහාද යථෝක්ත නිලධාරී තැනගෙන් විමසන්න.

9059

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොළොන්නරුවේ ගොවිපලේ ගොයම්පැල සිටවීම

පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් මස 7 වැනි දින පස්වරු 2.30 දක්වා පොළොන්නරුවේ ගොවිපලේ අක්කර 200 ක පමණ ගොයම් පැල සිටවීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ගොයම් පැල සිටුවීම පහත සඳහන් අන්දමට කල යුතුයි :—

(අ) තවානේ ගොයම් පැල වලට හානියක් නොවන අන්දමට පැල උදුරා මඩ සෝදා අඟල් 12-14 මහත සිටින සේ මිටි බැඳීම.

(ආ) එම මිටි ගොවිපලෙන් සපයන වාහනයකට පැටවීම.

(ඇ) පැල සිටවීමට නියමකර තිබෙන කුඹුර ළඟ පැල බෑම. එම පැල ඉන්දවීමට නියමිත කුඹුර ගොවිපල භාරකාර නිලධාරි තැන විසින් පෙන්වනවා ඇත. මිටකට පැල දෙකක් හෝ තුනක් සිට විය යුතු අතර, පැල සිටවීමේදී (1) අඟලකට වඩා ගැඹුරට පසයට නොකළ යුතුයි. දිනක උදුරන ලද පැල සියල්ලම පැය 24 ක් ඇතුලතදී කුඹුරේ ඉන්දවා නිම කළ යුතුයි.

(ඈ) ගොයම් පැල පේලි දිගේ පේලියෙන් පේලියට අඟල් 10 ක පරතරය ඇතිවද පේලිය දිගේ අඟල් 4 වත් 6 වත් පරතරය ඇතිවද සිටවිය යුතුයි.

(ඉ) දිනකට අක්කර 10 ක පමණ කුඹුරු ප්‍රමාණයක පැල සිටවීම කළ යුතුයි.

(ඊ) ඔක්තෝබර් මස 4 වැනි සතියේ පමණ සිට නොවැම්බර් මස අග දක්වා කාලය තුළදී පැල ඉන්දවා-නිම කළ යුතුයි.

2. පොළොන්නරුව කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැනගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් පෝර්ම කොළ ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා පාවිච්චි කළ යුතුය. ටෙන්ඩර් පත්‍රය පිටපත් දෙකකින් යුක්තවිය යුතුවාත් හැර එය අත්සන් තබා ලියුම් කවරයක බහා සීල් තබා " පොළොන්නරුව ගොවිපලේ ගොයම් පැල සිටවීමේ ටෙන්ඩරය " යන්න එම ලියුම් කවරයේ වම් පැත්තේ මුදුනේ ලියා පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත යැවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. තෝරාගන්නා ලද ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බැව් දන්වා දින 10 ක් ඇතුලත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරන අතර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඇතුළත් කරනවා ඇත.

4. ටෙන්ඩර් පත්‍ර පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ හැකිය. නොඑසේ නම් රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔහුගේ නියෝජිතයින් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය ලත් නිලධාරි තැන වන පේරාදෙණියේ ගොවිකම් දෙපාර්ත මේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් භාරගන්නා නිලධාරි තැන වෙත ටෙන්ඩර් පත්‍ර තමන්ම භාරදිය යුතුය. එසේ කරන ලද ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා සීල් තබා "පොළොන්නරුවේ ගොවිපලේ ගොයම් පැල සිටවීමේ ටෙන්ඩර් පත්‍රය " යන්න හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද එම ලියුම් කවරයේ සඳහන් කළ යුතුය.

5. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරණ දිනයේදීම ටෙන්ඩර් කරුවන්ට දන්වා යවනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 4 ක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුන හොත් එම ටෙන්ඩර්කරු වහාම ඒ බව පේරාදෙණියේ ගොවිකම් දෙපාර්ත මේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත දැනුම් දිය යුතුය. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර්කරුවන්ට උවමනානම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරණු ලැබේ.

7. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණුකළ යුතු අතර ඒවායේ යම්කිසි වෙනසක් කළහොත් එහි ටෙන්ඩර්කරුගේ කෙටි අත්සනද යෙදිය යුතුවේ. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්කර තිබෙන ගණන් අකුරෙන් හා ඉලක්කමෙන් සඳහන්කර තිබීය යුතුය

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් ටෙන්ඩර් පත්‍ර කැඳවා අවසාන දින සිට සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

9. පිළිගනු ලැබූ වැඩෙහි මුලු වටිනාකමෙන් සියයට පහක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගන්නා ලද ටෙන්ඩර්කරුවාට නියම කරණු ලැබේ. මෙම ඇප මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීමෙන් පසුවය. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක කරන අතර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඇතුලත් කරනවා ඇත. පොරොන්දු පත්‍රයට හෝ ඔප්පුවට අවශ්‍ය මුද්දරවල වටිනාකම තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

10. යම් කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය රජය සතුවේ.

11. කොන්ත්‍රාත්කරුවෙකුගේ සේවකයෙකු විසින් හෝ සේවකයෙක් වෙනුවෙන් හෝ 1934 රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) හෝ ඊට අදාල ව්‍යවස්ථානුකූලව වෙනස්කම් ඇතොත් ඒවා යටතේ හෝ ඉදිරිපත් කරණ ඉල්ලුම්පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. " ලාංකික යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි."

13. වැඩට ගැනීමට සුදුසු යයි හැඟෙන ඕනෑම කම්කරුවෙක් කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය රජය සතුවේ.

14. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට අවශ්‍යයයි පෙනීගියහොත් තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ වියදමෙන් ඇපකරුවන් එක් කෙනෙකු ලවා හෝ ඊට වැඩි ගණනක් ලවා හෝ පොරොන්දු ඔප්පුවක් අත්සන් කිරීමට සූදානමින් සිටිය තුයුය. මෙම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ අය විය යුතුයි.

15. කොන්ත්‍රාත්තුවේ සඳහන් වැඩය අසතුටුදායක ලෙස කිරීම නිසාත්, කොන්දේසි ඉටු නොකිරීම නිසාත් කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන සතුවේ.

16. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයේ නම සඳහන් කෙනෙකු සමග හෝ එම අය සහ එකතුව ඉදිරිපත් වන කෙනෙකු සමග හෝ රජයට නුසුදුසුයයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධවූන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුනහොත්, නැතහොත් ඔහු විසින් සපයා ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ එම ස්ථානයෙහි තැබුවහොත් එම දැන්වීම ඔහුට දුන් ලෙස සලකනු ලැබේ.

18. ටෙන්ඩර් කරුවන් විසින් ගොයම් කැපිය යුතු ස්ථානය බලා ටෙන්ඩර් දැමුවහොත් යෙහෙකි.

19. වැඩි විස්තර සඳහා පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ලියා විමසිය යුතුය. එසේ ලිවීමේදී රාජකාරි ලිපිනයට ලිවිය යුතුය.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 අගෝස්තු මස 17 වැනි දින,
පේරාදෙණියේ දිය.

8534

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පේරාදෙණියේ රේස්කෝස් පැල තවානේ ප්‍රධාන තැනට කහ උණ බම්බු පෝච්චි 23,000ක් සහ යෝධ උණ බම්බු පෝච්චි 5,000ක් සැපයීම**

පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම මූලස්ථාන නිලධාරි කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන විසින්, පහත සඳහන් දේවල් සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ඔක්තෝබර් මස 4 වෙනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

(1) හොඳින් මේරූ කහ උණ බම්බු පෝච්චි 23,000ක් සැපයීම. විෂ්කම්භය අඟල් 3යි, ගැටේ සිට උස අඟල් 10යි.

(2) හොඳින් මේරූ යෝධ උණ බම්බු. (ගල් උණ බම්බු නොවේ) පෝච්චි 5,000ක් සැපයීම. ඇතුළත විෂ්කම්භය අඟල් 4ක් සහ ගැටේ සිට උස අඟල් 12යි.

2. කෘෂිකර්ම මූලස්ථාන නිලධාරි කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම මූලස්ථාන කාර්යාලය, රාජකීය උද්‍යානය, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුණේ වම් කෙළවරෙහි "රේස්කෝස් තවානට කහ උණ බම්බු සහ යෝධ උණ බම්බු සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි. එක එක කාර්‍යයට වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළපසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ පිහිටි කෘෂිකර්ම මූලස්ථාන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දියයුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි "රේස්කෝස් තවානට කහ උණ බම්බු සහ යෝධ උණ බම්බු සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. රෙජිස්ටර් තැපැලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම මූලස්ථාන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම (මූලස්ථාන) කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිළි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ටෙන්ඩර් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. 1934රේ 19 වෙනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැදෙනු නොලැබේ.

17. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ඔක්තෝබර් මස ඇතුළුව මසකට කහ උණ බම්බු 5,000ක් සහ යෝධ උණ බම්බු 2,000හ ගණනේ සම්පූර්ණ ගණන අවසන් වනතුරු නොකඩවා සැපයිය යුතුයි.

18. වැඩි විස්තර පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම මූලස්ථානය කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

කෘෂිකර්ම අධ්‍යක්ෂ/පරිපාලන නිලධාරි.

1960 සැප්තැම්බර් මස 7 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම කාර්යාලයේදීය.

8916

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**හිඟුරක්ගොඩ ගොවිපලේ ගොයම් පැල සිටවීම**

පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් මස 30 වැනි දින පස්වරු 2.30 දක්වා හිඟුරක්ගොඩ ගොවිපලේ අක්කර 300ක පමණ ගොයම් පැල සිටවීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ගොයම් පැල සිටවීම පහත සඳහන් අන්දමට කළ යුතුයි :—

(අ) තවානේ ගොයම් පැලවලට හානියක් නොවන අන්දමට පැල උදුරා මඩ සෝදා අඟල් 12-14 මහත සිටින සේ මිටි බැඳීම.

(ආ) එම මිටි ගොවිපලෙන් සපයන වාහනයකට පැටවීම.

(ඇ) පැල සිටවීමට නියමකර තිබෙන කුඹුර ළඟ පැල බෑම. එම පැල ඉන්දවීමට නියමිත කුඹුර, ගොවිපල භාර නිලධාරි තැන විසින් පෙන්වනවා ඇත. මිටකට පැල දෙකක් හෝ තුනක් සිටවිය යුතු අතර, පැල සිටවීමේදී (1) අඟලකට වඩා පස යට නොකළ යුතුයි. (2) දිනක උදුරන ලද පැල සියල්ලම පැය 24ක් ඇතුලතදී කුඹුරේ ඉන්දවා නිම කළ යුතුයි.

(ඈ) ගොයම් පැල පේලි දිගේ පේලියෙන් පේලියට අඟල් 10ක පරතරය ඇතිවද පේලිය දිගේ අඟල් 4 වත් 6 වත් පරතරය ඇතිවද සිටවිය යුතුයි.

(ඉ) දිනකට අක්කර 10 ක පමණ කුඹුරු ප්‍රමාණයක පැල සිටවීම කළ යුතුයි.

(ඊ) ඔක්තෝබර් මස 10 වැනි දින සිට නොවැම්බර් මස අග දක්වා කාලය තුලදී පැල ඉන්දවා නිමකළ යුතුයි.

2. පොළොන්නරුව කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැනගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ෆෝර්ම කොළ ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා පාවිච්චි කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රය පිටපත් දෙකකින් යුක්තවිය යුතුවාත් හැර එය අත්සන් තබා ලියුම් කවරයක බහා සීල් තබා "හිඟුරක්ගොඩ ගොවිපලේ ගොයම් පැල සිටවීමේ ටෙන්ඩරය" යන්න එම ලියුම් කවරයේ වම් පැත්තේ මුදුනේ ලියා පේරාදෙණියේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත යැවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25ක් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ. තෝරාගන්නා ලද ටෙන්ඩර්

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 සැප්තැම්බර් මස 28 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍ය වී නම් එය සැපයීමට ටෙන්ඩර් කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 සැප්තැම්බර් මස 9 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් කායඹාලයේදීය.

9063

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වෛද්‍ය ආයතනවලට අයිස් සැපයීම

වර්‍ෂ 1960 නොවැම්බර් 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර 30 වෙනිදාසින් අවසන්වන වර්‍ෂය තුළ රජයේ වෛද්‍ය ආයතනවලට අයිස් සැපයීම සඳහා අයිස් නිෂ්පාදනය කරන හෝ බෙදාහරින ලාංකික යන්ගෙන්, ලාංකික වෙළඳ ආයතනවලින් හෝ සමාගම් වලින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර, කොළඹ, ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ තැ. පෙ. 500, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 11 දින පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රු. 100 ක මුදලක් කොළඹ, සෞඛ්‍යසේවා අධ්‍යක්‍ෂ තැනගේ නමට, කච්චේරියක හෝ කොළඹ කොටුවේ බ්‍රිස්ටල් වීදියේ ලංකා බැංකුවේ තැන්පත්කර, මුදල් තැන්පත් කළ බවට නිකුත්කරන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට ඇමිනිය යුතුය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම කොළ ගාලු මුවදොර මහාලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයෙන් ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන තැන්පත් මුදල් ලංකා බැංකුව විසින් භාර නොගනු ලැබේ.

3. ටෙන්ඩර් කරුවන් විසින් මෙහි පහත උපලේඛනයෙහි ඇති එක් එක කොටසට පොදු අයකිරීමක් සඳහන් කළ යුතුය.

4. ටෙන්ඩර් පත් කොළඹ ගාලු මුවදොර මහාලේකම් කාර්යාලයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අංක 155 දරණ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුයි. නැතහොත් ඒවා පළමුවන ඡේදයෙහි සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් කරුවන් සිය ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් එවීමට අසතුටු නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට, මෙහි පළමුවන ඡේදයෙහි සඳහන් ලිපිනය ඇති ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට අවසරය ඇති 'සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට පෞද්ගලිකව ටෙන්ඩර් පත්‍ර භාරදී එය ලැබුණ බවට කුවිතාන්සියක් ද ලබාගත හැකිය.

සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ, එය කුමන සේවාවක් සඳහාද යන වගත්, ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයත් සඳහන් කළ යුතුය.

**සැලකිය යුතු.**—ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින පෙරවරු 10ට පසු තැපෑලෙන් එවන හෝ පැමිණ භාර දෙන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂෙප කරනු ලැබේ.

5. මෙහි පළමුවන ඡේදයෙහි සඳහන් ස්ථානයේදී ටෙන්ඩර පත් විවෘත කරනු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍රවල සඳහන් මිළ ගණන් ද, පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර් කරුවකුට ටෙන්ඩර පත්‍රය පරීක්‍ෂා කිරීමට අවශ්‍ය වුවහොත්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ අනුමැතිය ඇතිව ඒවායේ දෙවන පිටපතක් පරීක්‍ෂා කළ හැකිය.

6. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් රු. 1,000ක ඇප මුදලක් තැබිය යුතුය. එමෙන්ම තමන් භාරගන්නා ලද කොන්ත්‍රාත්තුව නිසි ආකාර ඉටු කිරීම පිළිබඳව ගිවිසුමකට ඇතුලත් විය යුතුය. එසේ නොකළහොත් ඉහත සඳහන් ඇපය රාජසන්තක කරනු ලැබේ. තවද මතුවට කිසිම දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත්තු ඔවුනට දීම වැලැක්වීම සඳහා ටෙන්ඩර් මණ්ඩලයට මේ බව දැනුම් දෙනු ලැබේ.

7. කිසිම ගිවිසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීම ද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්‍ෂෙප කිරීමේ බලය ද රජය සතුව ඇත.

8. වැඩි විස්තර කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලය යාබද "බී" අක්‍ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයෙන් ලබාගත හැකිය.

ඇස්. ඥාණසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ. 12.9.60.

### ඉහත සඳහන් උපලේඛනය

(1) කොටස, කොළඹ ඇති වෛද්‍ය ආයතන—අවශ්‍ය අවස්ථාවන්හි ආයතනවලට අයිස් ගෙන ගොස් භාරදීම.

(2) කොටස, අංගොඩ මානසිකාරෝග්‍යශාලාව, අංගොඩ උණ රෝහල—අවශ්‍ය අවස්ථාවන්හි ඒ ආයතන වලට අයිස් ගෙනගොස් භාරදීම.

(3) කොටස, රාගම රජයේ රෝහල, වැලිසර ළය රෝහල—අවශ්‍ය අවස්ථාවන්හි ඒ ආයතන වලට අයිස් ගෙනගොස් භාරදීම.

(4) කොටස, දිවයිනෙහි අනිත් වෛද්‍ය ආයතන—අවශ්‍යවූ විටක ඒ වෛද්‍ය ආයතනයට ඉතා කිට්ටු දුම්රිය පලට අයිස් යැවීම.

9070

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**— වර්ෂ 1960 ඔක්තෝබර් 1 වනදා සිට 1961 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන්වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ ගාලු මුවදොර මහ ලේකම් කායඹාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

**සැ. යු.**—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කායඹාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කායඹාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කායඹාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නො වන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ වීස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩරපත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලය, ගාලු මුවදොර, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පසු උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතු මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩරපත් මෙම කායඹාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද

පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවූවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන් හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන්ද සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතීනම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩ කඩ සලසාදෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේ ය.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1960 අගෝස්තු මස 29 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
මුදල් අංශය,
ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලය,
කොළඹ.

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල් | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය සහ වේලාව | ආහාර ප්‍රමාණයන් දල වශයෙන් | | | | | | | |
| | | | | සේවකයන්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| | රු. ශ. | රු. ශ. | | | | | | | | | |
| **නුවර කොට්ඨාශය :** | | | | | | | | | | | |
| ගිනිගත්හේන ග්‍රාමීය රෝහල සහ මාතෘ නිවාසය ... ... | 100 0... | 400 0... | 21.9.1960 පූ. භා. 10 ට | 200... | 150... | 150... | 650 | 450... | 250... | 400... | 1,800 |
| **බදුල්ල (කොට්ඨාශය :** | | | | | | | | | | | |
| බණ්ඩාරවෙල ග්‍රාමීය රෝහල සහ මාතෘ නිවාසය ... ... | 100 0... | 600 0... | 21.9.1960 පූ.භා. 10 ට | 650... | 500... | 500... | 2,200 | 1,400... | 1,100... | 1,100... | 5,200 |

8512

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා පහත සඳහන් කොන්දේසි අනුව අනුරාධපුර නියෝජ්‍ය ආහාර පාලක තුමාගේ බඩු සැපයීමේ මධ්‍යස්ථානයේ සිට ඇදිහැස පිටි බෙදා හැරීම**

සම්පූර්ණ කරන ලද ටැන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිනිය, අධ්‍යාපන කාර්යාලය, අනුරාධපුර යනුවෙන් සඳහන් කොට 1960.10.10 වැනි දින පෙරවරු 9.30ට ප්‍රථම ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ " ඇදිහැස පිටි බෙදීම සඳහා ටැන්ඩර් පත්‍ර " යන්න සඳහන් කළ යුතුයි. ටැන්ඩර් පත්‍රයේ ඇතුළත් කවු ගැම් ආදීය ලඟ අත්සන් තැබිය යුතු වේ. සෑම ටැන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුයි.

2. මේ සේවය සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක රුපියල් 100 ක් තැන්පත් කළ බවට අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනිය වෙත 1960 ඔක්තෝබර් 7 දින දක්වා රිසිට් පත් ඉදිරිපත් කළ විට ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. මේ සඳහා චැක් පත්, මුදල් ඇණවුම්, පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම පිණිස වුවමනා කරන " පේයින් ස්ලිප්ස් " අනුරාධපුර අධ්‍යාපන නිලධාරිවරියගෙන් ලබාගත හැක.

4. දෙවෙනි ඡේදයේ සඳහන් පරිදි ටෙන්ඩර් ඉදිරිපත් කරන විට අනුරාධපුර අධ්‍යාපන නිලධාරිවරියගෙන් ලබා ගත් ටෙන්ඩර් පිට පත් දෙකකින් යුක්ත විය යුතුයි. මේ ගැන සියලු විස්තර එතුමියගෙන් ලබාගත හැක.

5. තෝරාගනු ලබන ටෙන්ඩර් කරුවන් විසින් අධ්‍යාපන නිලධාරිනියගෙන් නිකුත් කිරීමේ නියෝග ලැබී තෙදිනක් ඇතුළත පාසල් පුළුස්සන්නන් වෙත පිටි ගෙන ගොස් භාර දිය යුතුයයි බලාපොරොත්තු වනු ලැබේ,

6. තෝරාගත් ටැන්ඩර්කරු විසින් පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට ප්‍රථම තම කාර්ය සතුටුදායක ලෙස ඉටු කිරීමේ ඇපයක් වශයෙන් රුපියල් 500 (පන්සියයක) මුදලක් කච්චේරියේ හෝ ලංකා මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කරන ලෙස නියම කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට තෙමසක් ගතවන තුරු ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට හැකිවනසේ ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තබා සිටිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේදී ටෙන්ඩර් පත්‍රයක කුමන කොටසක් භාරගැනීමේදී හිමිකම රජය සතුය.

9. අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිනියගේ අවසරයක් නොමැතිව මෙම කොන්ත්‍රාත්තුව අන්‍යයෙකුට පැවරීම හෝ බද්දක් දීම නොකළ යුතුය.

10. පිටි ගෙනයෑම සඳහා ඉල්ලුම් කරන මුදලට ඒවා බෑම් සඳහා වියදමද ඇතුළත් විය යුතුයි.

11. ගැනුම්කරු විසින් පිටි රැස්කර ඇති ස්ථානයේ සිට බේකරියට පිටි ගෙන යෑමට අමතර වශයෙන් එක් බේකරියක සිට අනිත් බේකරියට පිටි ගෙන යෑමද කළ යුතු වේ.

12. තෝරාගනු ලබන ටෙන්ඩර්කරුවන් විසින් තම සේවය කර ගෙන යෑම සඳහා නුපුහුණු හෝ පුහුණු ලාංකික කම්කරුවන් යෙදිය යුතුය. මේ සඳහා වුවමනා කරන කම්කරුවන් ටෙන්ඩරයේ සඳහන් පරිදි එම සේවය කරන ප්‍රදේශයෙන්ම සපයා ගත යුතුය. මෙය ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩරය ඉදිරිපත් කිරීමේදී තිබිය යුතු රෙකුලාසියක් වනවා ඇත. මේ නීති රීති කඩකළොත් තම ටෙන්ඩරය අවලංගු වනවා ඇත. ප්‍රාදේශීය නොවන, ලාංකික නොවන කම්කරුවන් සේවය සඳහා අවශ්‍ය නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගේ අනුමතිය අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ මගින් ලබාගත යුතුය. මෙවැනි අනුමතියක් නොලබා ප්‍රාදේශීය නොවන, ලාංකික නොවන කම්කරුවන් ටෙන්ඩරයේ සඳහන් ප්‍රදේශයේ සේවය සඳහා යෙදවීම තහනම්ය.

1960 ඔක්තෝබර් 6 වැනි දින පෙරවරු 10ට ප්‍රධාන විදුලි සන්දේශ කාර්යාලයේදී ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. මේ අවස්ථාවේදී ටැන්ඩර් කරුවනට එහි පැමිණ සිටිය හැකිය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ, 1960.9.6.

9076

---

## පොල් විකිණීම

කොළඹ කච්චේරියේ දිසාපතිතැන විසින් කටුනායක රාජකීය ලංකා ගුවන් හමුදාව පිහිටි ඉඩමෙන් නෙලනලද 1,72,000 පමණ වූ පොල් තොගයක් විකිණීම සඳහා සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් මස 30 වන සිකුරාදා දවල් 12 දක්වා භාරගනු ලැබේ.

ටෙන්ඩර්කරු විසින් මුළු පොල් තොගයම මිළ දී ගතයුතු අතර ටෙන්ඩර් පත්‍රයේ ඉල්ලුම් කළ යුත්තේ පොල් 1,000 කට ගෙවන ප්‍රමාණයය.

2. කොළඹ දිසාපති තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ඒවා සම්පූර්ණ කර එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා කොළඹ කච්චේරියේ දිසාපතිතැන වෙත එවිය යුතුයි. එහි මුදුනේ වම් කොනෙහි "රාජකීය ලංකා ගුවන් හමුදාව පිහිටා ඇති ඉඩමේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක්ද සහිතව සීල් තබනලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑව්වොත් එය කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි. ටෙන්ඩර් පත්‍රය බහා ලන ලද කවරයේ "රාජකීය ලංකා ගුවන් හමුදාව පිහිටා ඇති ඉඩමේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා දින උදේ 11 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍ර වෙනුවෙන් රුපියල් (100) සියයක් කොළඹ කච්චේරියේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. තෝරා පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින (10) දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කර ගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක වෙනවාත් හැර ඔහුට විරුද්ධව නීති මගින් හෝ වෙනත් ක්‍රමයකින් කටයුතු කිරීමේ බලය ඇතිව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නට ඉඩ තිබේ.

5. 1960 සැප්තැම්බර් මස 30 වන දින දවල් 12ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. ඉල්ලුම් කරුවනට කැමතිනම් මේ අවස්ථාවේදී පැමිණිය හැක.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කොළඹ දිසාපති වෙත තබා ගනී.

9. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවනලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුනහොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම් ඇතුලත් වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කොළඹ දිසාපතිතුමා විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන් සඳහන් කරනලද මිළ ගණන් පිට ටෙන්ඩර් බාරගන්නා ලද අවසාන දිනයේ සිට සති (3) තුන ඇතුළතදී ටෙන්ඩර් බාරගැනීම බලාපොරොත්තුවිය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල්වලට ගෙවා ඉවත්කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

16. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතැන ගෙන් හෝ මීගමුවේ ප්‍රාදේශිය ආදායම් පාලක තැන ගෙන් දැනගත හැක.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1960 සැප්තැම්බර් 12 වැනි දින,
කොළඹ කච්චේරියේදීය.

9065

---

## 1960-1961 ආදායම් වර්‍ෂයේ මහනුවර දිස්ත්‍රික්කය තුළ බඩු බාහිරාදිය ගෙන යෑම

1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනිදාසින් අවසන්වන ආදායම් වර්‍ෂය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ පිහිටුවා ඇති ජනපදවල මෝටර් රථයෙන් යාහැකි ස්ථානවලට ඉරාපු ලී, වැව්ලි වර්ග ආදිය දුම්රිය පොළවල හා බඩු ගබඩාවල සිට ගෙන යෑම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා ගෙන් ලබාගන්නා ලද පෝර්ම කොළවල පමණක්ම විය යුතුයි. පිළි ගන්නා ලද පෝර්ම කොළවල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්මයක් ලබා ගන්නට ප්‍රථම මහනුවර කච්චේරියේ රුපියල් 50ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1960. 9. 30 වැනි දින දවල් 12 වන තුරු පමණක්ය.

4. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් මුද්‍රා තබන ලද කවරයක බහා එහි මතුපිට "1960-61 වර්‍ෂය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ බඩු බාහිරාදිය ගෙන යෑම සඳහා ටෙන්ඩරය" යන්න පැහැදිළියෙන් ලියා, ලියාපදිංචි කළ තැපෑලෙන් මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත 1960.10.3 වැනි දින පෙරවරු 9.30ට ප්‍රථම ලැබෙන පරිද්දෙන් එවිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන් සතු බලපත්‍ර ලත් මෝටර් ලොරි රථ ගණන සහ ඒවා හැඳිනගැනීමේ අංකද, ධාවන මාර්ග බල පත්‍රද සඳහන් කළ යුතුයි. තවද එකී ලොරි රථවල තාරබර සහ ගෙන යෑමට නියමිත බර ප්‍රමාණය සඳහන් කළ යුතුයි.

6. ටෙන්ඩර්කරුවන් විසින් හොණ්ඩරයක් හැතැප්මක් දුර ගෙන යෑමට අය කරන මුදල සඳහන් කළ යුතුයි. ගෙවනු ලබන්නේ ඉතාමත් කිට්ටු සම්පූර්ණ හොණ්ඩරයට පමණකි. ලොරියක සම්පූර්ණ බඩු බරක් ගෙන ගියවිට ගෙවනු ලබන්නේ ලොරියේ ගෙනයෑමට නියමිත බර ප්‍රමාණයට පමණකි. ඉරාපු ලී ගෙනයෑම සම්බන්ධයෙන් හැතැප්මකට ඝන අඩියකට අයකරන මුදල සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර්කරුවන් විසින් පහත සඳහන් කරුණුවලටත් අය කරන මුදල් ගණන් වෙන් වශයෙන් දැක්විය යුතුයි:—

(1) දුම්රිය බඩු පෙට්ටි වලින් බඩු බෑමටත්, නැවත ලොරිවලට පැට වීමටත්, ගමන අවසානයේදී බඩු බෑමටත් අයකරන මුදල, ඉරාපු ලී ඝන අඩියක් බෑමට සහ පැටවීමට අයකරන මුදලත් සඳහන් කළ යුතුයි.

7. ටෙන්ඩර් පත්‍රවල යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් ඇති වුව හොත් ඒ සියල්ල ටෙන්ඩර්කරුගේ කොට අත්සනින් සහතික කළ යුතුයි. ටෙන්ඩර් මුදල අකුරින් හා ඉලක්කමින්ද සඳහන් කළ යුතුයි. මෙහි වෙනස්වීමක් ඇති වුවහොත් අකුරින් සඳහන් කර ඇති මුදල පමණක් පිළිගනු ලැබේ.

8. මෙහි සඳහන් සෑම නීතියකටම යටත් නොවන ටෙන්ඩර් පත්‍ර සලකා බලනු නොලැබේ.

9. මීට පෙර වතාවල වැඩ පැහැර හැරියේ යයි පිළිගෙන ඇති ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් භාරගනු නොලැබේ.

10. සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කිරීමේ බලයත්, යම් ටෙන්ඩර යක කොටසක් පමණක් භාරගැනීමේ බලයත් මහනුවර දිස්ත්‍රික්කයේ ඒජන්තතුමා වෙත පැවරී ඇත.

11. ටෙන්ඩර් වසන දින පටන් සති තුනක් ඇතුළත කාලයේදී කිසිම ටෙන්ඩර්කරුවකුට ඔහුගේ ටෙන්ඩරය ආපසු ගැනීමට බලයක් නැත. යම් ටෙන්ඩර්කරුවෙක් එසේ කළහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කර වැඩ පැහැර හරින ටෙන්ඩර්කරුවන්ගේ නාම ලේඛනයට ඔහුගේ නමත් ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් රුපියල් 1,000 ඇපයක් පිට මහනුවර දිස්ත්‍රික්කයේ ඒජන්තතුමා සමග කොන්ත්‍රාත්තුවකට නොහොත් ගිවිසුමකට අත්සන් තැබිය යුතුයි. මහනුවර දිස්ත්‍රික්කයේ ඒජන්තතුමා විසින් ලියා දන්වා දින 7ක් ඇතුළතදී ඇප මුදල තැන්පත් නොකරන හෝ, ගිවිසුමට අත්සන් නොතබන ටෙන්ඩර් කරුවන්ගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ. මහනුවර දිස්ත්‍රික්කයේ ඒජන්තතුමා විසින් තෝරාගත් ටෙන්ඩර්කරුට, ඔහු විසින් දෙන ලද අන්තිම ලිපිනයට, ඔහුගේ ටෙන්ඩරය තෝරාගත් බව ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එම ලිපිනයට බෙදාදුන් විට, ටෙන්ඩර්කරු විසින් එම ලියවිල්ල ලත් බවට ඒත්තු ගනු ලැබේ.

ජේ. ඇස්. ප්‍රනාන්දු,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා වෙනුවට.

1960 සැප්තැම්බර් 6 වෙනි දින,
මහනුවර කච්චේරියේදීය.

8895

---

## පාවිච්චියට නුසුදුසු ඩීසල් ලොරි විකිණීමට ටෙන්ඩර් කැඳවීමයි—යාපනය

යාපනයේ දිසාපති තැන විසින් 1960වේ ඔක්තෝබර් මස 24 වැනි දින පෙරවරු 11.30 දක්වා යාපනය කච්චේරි භූමියේ නවතා ඇති පාවිච්චියට නුසුදුසු පහත සඳහන් කර ඇති ලියාපදිංචි කිරීමේ අංක දරණ ලොරි විකිණීම සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

අංක අයි. සී. 1168, අයි. සී. 1107 හා අයි. සී. 1177 වේ.

ටෙන්ඩර් කළ යුත්තේ යාපන කච්චේරියෙන් ලබාගත යුතු පෝර්මවල පිටපත් දෙකකින්ය. ටෙන්ඩර් පෝර්ම 1960වේ ඔක්තෝබර් 21දා තෙක් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ එක් ලොරියකට රු. 100 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක ගෙවා ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය.

ටෙන්ඩර් පත් කවරයක දමා වසා සීල් තබා කවරයේ වම් කෙළවරේ "පාවිච්චියට නුසුදුසු ඩීසල් ලොරි විකිණීම" යයි සඳහන් කර තිබිය යුතුය.

ටෙන්ඩර් පත් 1960වේ ඔක්තෝබර් 24 දින දහවල් 12ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන වේලාවේදී එහි (එම ස්ථානයෙහි) සිටින්නට අවසර ඇත.

මෙකී ලොරි ඕනෑම කාර්‍යාලයීය දිනක, සෙනසුරාදාවන් හැර පෙරවරු 10ට හා පස්වරු 3 අතරතුර යාපන කච්චේරි භූමියේදී බලාගත හැකිය. වැඩි විස්තර යාපනයේ දිසාපති තැනගෙන් දැනගත හැකිය.

එම්. ශ්‍රී කාන්තා,
යාපනයේ දිසාපති තැන.

1960වේ සැප්තැම්බර් මස 9 වෙනි දින,
යාපනය කච්චේරියේදීය.

9058

---

## මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජනපදවලට කෙසෙල් පැල සැපයීම

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි ගොවිජනපදවලට "කෝලිකුට්ටු" සහ "ඇඹුල්" කෙසෙල් පැල සැපයීම සඳහා 1960 ඔක්තෝබර් මස 7 වැනි දින සවස 2.30 දක්වා කොළඹ, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. එක් එක් ගොවි ජනපදයට උවමනා පැල ප්‍රමාණයන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත. පිළිගත් ටෙන්ඩර්කරුවන් විසින් කෙසෙල් පැල ඒ ඒ ජනපදවලට ගෙනැවිත් භාරදිය යුතුය.

ටෙන්ඩර් එවිය යුත්තේ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක රුපියල් 25ක තැන්පත් මුදලක් තබා ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට මොණරාගල දිසාපතිතුමා විසින් 1960 ඔක්තෝබර් මස 3 වෙනිදා සවස 3 දක්වා නිකුත් කරනු ලබන නියමිත ටෙන්ඩර් පෝර්මවලය.

සෑම ටෙන්ඩරයක්ම සුරක්ෂිත ලෙස සීල් තබා ලියුම් කවරයේ "කෙසෙල් පැල සැපයීම, මොණරාගල දිස්ත්‍රික්කය" යනුවෙන් සඳහන් කොට කොළඹ ඉඩම් කොමසාරිස් තුමාගේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නැතහොත් කොළඹ ගාලුමුවදොර පිහිටි මහලේකම් ගොඩනැගිල්ලේ 3 වැනි තට්ටුවේ අංක 320 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය හැක.

**කොන්දේසි :**

(1) ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාරගැනීමේ අයිතිය සම්පූර්ණයෙන්ම ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත පැවරේ.

(2) එක් එක් වැවිලි ද්‍රව්‍ය තිබෙන ස්ථානවලින් ඒවා බෙදා හැරීමේ මධ්‍යස්ථානවලට ගෙන යා යුතු ප්‍රමාණය මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් තීරණය කරනු ඇත.

(3) වැවිලි ද්‍රව්‍ය තිබෙන ස්ථානවලින් බෙදා හැරීමේ මධ්‍යස්ථානවලට ගෙන යාමේ කාල සීමාව සහ ගෙන යා යුතු ප්‍රමාණය වරින් වර දිසාපති තුමා විසින් නියම කරනු ලැබේ.

(4) දිසාපති තුමා විසින් හෝ ඔහුගෙන් බලය ලත් නිලධාරි තැන විසින් දින 7 ක දැන්වීමකින් පසුව වැවිලි ද්‍රව්‍ය තිබෙන ස්ථානයේ සිට බෙදාහැරීමේ මධ්‍යස්ථානවලට ගෙන යාමට පිළිගත් ටෙන්ඩර් කරුට දන්වනු ලැබේ. මෙම දැන්වීම ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පෝර්මයේ සඳහන් කරන ලද ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ඇත.

(5) වැවිලි ද්‍රව්‍ය ගෙන යාමට මිල ගණන් ටෙන්ඩරයේ සඳහන් කරන විට එම ගණනට වැවිලි ද්‍රව්‍ය පැටවීමේ සහ බෑමේ ගාස්තුවද ඇතුළත් කළ යුතුය.

(6) දිසාපති තුමා විසින් පත් කරන ලද නිලධාරිතැනගේ උපදෙස් වලට අනුව වැවිලි ද්‍රව්‍ය පැටවීම හා බෑම කළ යුතුයි.

(7) පිළිගත් ටෙන්ඩර්කරු විසින් වැවිලි ද්‍රව්‍ය ගෙන යාමේ දී ඒවායේ ආරක්ෂාව ගැන වග කිව යුතුය.

(8) දිසාපති තුමා විසින් පත් කරන ලද නිලධාරීන් විසින් අනුමත කරන ලද කෙසෙල් පැල පමණක් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් ගෙනැවිත් දෙන ලද වැවිලි ද්‍රව්‍යවල නුසුදුසුතාවය නිසා ප්‍රතික්ෂෙප කිරීම ආදී කරුණු වලට දිසාපති තුමා පත් කරන ලද නිලධාරීන් ගන්නා තීරණයන් සම්බන්ධව විරුද්ධවාදී කමක් දැක්වීමට ටෙන්ඩර්කරුවන්ට අවසර නොමැත.

(9) අවශ්‍ය යයි සිතෙන අවස්ථාවකදී කෙසෙල් පැල පඳුරෙන් වෙන් කර ගැනීම කළ යුත්තේ දිසාපති තුමා පත් කරන ලද නිලධාරි තැනගේ පරීක්ෂාව යටතේය.

(10) සෑම කෙසෙල් පැලයක්ම කෙසෙල් අලය හැර අඟල් 12ක් උස් විය යුතුයි.

(11) කෙසෙල් පැල රැස් කරන ස්ථානයේ පිහිටීම පිළිබඳ විස්තර සෑම ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝර්මයේ පිට පැත්තේ සඳහන් කළ යුතුයි.

පහත පළවන උපලේඛනයේ සඳහන් වන පරිදි ටෙන්ඩර් එවිය යුත්තේ එක් වර්ගයක කෙසෙල් පැල සඳහා පමණක්ය.

(පහත සඳහන් ප්‍රමාණයන් දක්වෙන්නේ දළ වශයෙන් බව සලකන්න.)

### උපලේඛනය

| ව්‍යාපාරය | ඇඹුල් | කෝලිකුට්ටු |
|---|---|---|
| 1. ඇටිමොලේ | 9,100 | — |
| 2. මාගන් දන ඔය | 7,280 | 7,280 |
| 3. හුලන්දාව ඇල්. බී. 2 | 6,440 | 6,440 |
| 4. හුලන්දාව ඇල්. බී. 3 | 1,400 | 1,400 |
| 5. හුලන්දාව ඇල්. බී. 4 | 4,480 | 4,480 |
| 6. හුලන්දාව ආර්. බී. 1 | 10,500 | 10,500 |
| | 39,200 | 30,100 |

වී. පී. සිල්වා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙනුවට.

1960 සැප්තැම්බර් මස 8 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේදීය.

9045

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

මහරගම රජයේ අභ්‍යාස විද්‍යාලයට ලී බඩු සහ උපකරණ සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහනය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ දකුණු කොළඹ භාර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා

ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,30,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.12.

9073/1

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

බදුල්ල කච්චේරියේ වැඩිපුර ශාඛා සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහන සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. බදුල්ල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 65,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.12.

9073/2

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

වරකාපොල ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ ඇඳන් 12 ක ළමා වාට්ටුවක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්ත මේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේ දී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කෑගල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 32,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.12.

9073/3

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

නල්ලූර් පරන්තන්-පුනේරියන් පාරේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තු වේ ඕවර්සියර් තැනගේ නිවාසයෙහි අළුත්වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර් යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 9,800 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.12.

9073/4

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

නුවර තැපැල් කාර්යාලයේ අතිරේක වැඩ සහ අළුත්වැඩියා කිරීම්—සයිකල් 50 කට පමණ සෑහෙන සයිකල් මඩුවක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. නුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කල විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝපරේෂන්".
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.12.

9073/5

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

රාජකීය විද්‍යාලයට ලී බඩු සැපයීම සහ සවිකිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 27,500ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝපරේෂන්".
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.12.

9073/6

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ටැන්ඩර් ප්‍රතිඵල.—නාච්චාදූවේ ඕවර්සියර් නිවාසය ගොඩනැගීම.

සමත්වූ ටැන්ඩර් ඉල්ලුම්කරු.—එච්. ඩබ්ලිව්. ද අල්විස් මයා., ගල්කුලම.

අනිකුත් ටැන්ඩර් ඉල්ලුම් කල අය.—කේ. පී. කුමාරස්වාමි මයා., කුමාරන් ස්ටෝර්ස්, අනුරාධපුරය.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු තැන.
මහකනදරාව.

1960 සැප්තැම්බර් 7 වැනි දින,
මිහින්තලේ.

8906

---

# බඩු බාහිරාදිය විකිණීම

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පාවිච්චි කළ නොහැකි බඩු වෙන්දේසියේ විකිණීම

ඉහත සඳහන් දෙපාර්තමේන්තුවේ පාවිච්චි කළ නො හැකි බඩු 1960. 9. 29 දින පෙරවරු 10 ට මෙම දෙපාර්තමේන්තුවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එම බඩු සතියේ දිනයන්හි වැඩ කරන වේලාවන් තුළ දෙපාර්තමේන්තු භූමියේ දී පරීක්‍ෂා කර බැලිය හැක. වෙන්දේසියෙන් මිලයට ගන්නා අය එම බඩුවල වටිනාකම එවේලේම ගෙවිය යුතු අතර වෙන්දේසිය අවසානයේදීම එම බඩු ඉන් බැහැර ගෙන යා යුතුයි. බයිසිකල් 2 ක්, යතුරු ලියනයක්, ඔර්ලෝසු, වඩු කාර්මික හා යාන්ත්‍රික උපකරණ සහ කායසීලයීය බඩු බාහිරාදියවලින් මේ බඩු සමන්විතය.

ඞී. ජේ. ජයසිංහ,
වැ. බ. අධ්‍යක්‍ෂ.

1960. 9. 6.
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බුලර්ස් පාර, කොළඹ 7.

8879

---

## පාවිච්චි කිරීමට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය තොගයක් 1960 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා පූර්වභාග 10.30ට කන්කසන්තුරේ යාපනේ ගුවන් තොටුපළේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය සඳහා තබා ඇති බඩු වර්ගවල ලැයිස්තුවක් කොළඹ, තැ. පෙ. 535, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනගෙන් ඉල්ලුම් කොට ලබාගත හැක.

2. කන්කසන්තුරේ යාපනේ ගුවන් තොටුපළේදී 1960. 10. 13 වැනි දින පස්වරු 2.00 සිට 4.30 දක්වා ද, වෙන්දේසිය පවත්වන දින පෙරවරු 9.00 සිටද එම බඩු බාහිරාදිය පරීක්ෂා කළ හැක.

3. වෙන්දේසියේදී මිලට ගනු ලැබූ බඩු සඳහා ඒ ස්ථානයේදීම මුදල් ගෙවා පැය 24ක් ඇතුළතදී ගෙන යා යුතුයි.

ඊ. ඇම්. විජේනායක,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂක.

කොළඹ 1,
1960 සැප්තැම්බර් මස මස 12 වැනි දින.
9082/1

---

## පාවිච්චි කිරීමට අයොග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස්, ගිනි නිවීමේ උපකරණ ආදී සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය 1960 ඔක්තෝබර් මස 12 වැනි බදාදා ප. භා. 2.00ට රත්මලානේ අත්තිඩිය පාරේ පිහිටි සහකාර ගුවන් විදුලි ඉංජිනේරු තැනගේ කාර්‍යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය සඳහා තබා ඇති බඩු වර්ගවල ලැයිස්තුවක් කොළඹ තැ. පෙ. 535, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනගෙන් ඉල්ලුම් කොට ලබා ගත හැක.

2. සහකාර ගුවන් විදුලි ඉංජිනේරු තැනගේ කාර්‍යාලය අසලදී එදින උදේ 9.00 සිට වෙන්දේසිය සඳහා ඇති බඩු බාහිරාදිය පරීක්ෂා කළ හැක.

3. වෙන්දේසියේදී මිලට ගනු ලැබූ බඩු සඳහා ඒ ස්ථානයේදීම මුදල් ගෙවා පැය 24 ක් ඇතුළතදී ගෙන යා යුතුයි.

ඊ. ඇම්. විජේනායක,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂක.

කොළඹ 1,
1960 සැප්තැම්බර් මස 12 වැනි දින.
9082/2

---

## විශේෂ නිවේදනයයි

1960 සැප්තැම්බර් 26 වැනි සඳුදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 සැප්තැම්බර් 30 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 සැප්තැම්බර් 24 වැනි සෙනසුරාදා පස්වරු 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 සැප්තැම්බර් 9 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

8945

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.